# කැස්බෑව
# ගමේ ආණ්ඩුව

කැස්බෑව හිටපු ප්‍රාදේශීය ලේකම් / විශේෂ කොමසාරිස්

**කේ. ඒ. තිලකරත්න**

විසින් සම්පාදිතයි

# පිදුම

කැස්බෑව බදු ගෙවන
ජනතාවට

---

## කැස්බෑව නගර සභාව

**දැක්ම:-** සේවා තුළින් ජනහද දිනමු

**මෙහෙවර:-** කැස්බෑව නගර සභා බල ප්‍රදේශයේ ජනතාවගේ සුබ විහරණය ප්‍රවර්ධනය කිරීම සහ ජීවන තත්ත්වය නංවාලීම සඳහා නගර සභාව සතු මානව හා භෞතික සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිත කරමින් සෞඛ්‍ය සේවා, මංමාවත්, පොදු උපයෝගීතා සේවා මෙන්ම සුබසාධක සේවා සැපයීම.

# කැස්බෑව
# ගමේ ආණ්ඩුව
## එදා මෙදා සහ මතුදා

| | | |
|---|---|---|
| එදා | - | මාම්පේ කැස්බෑව ගම් සභාව |
| | - | කැස්බෑව සුළු නගර සභාව |
| | - | කැස්බෑව ප්‍රාදේශීය සභාව |
| මෙදා | - | **කැස්බෑව නගර සභාව** |
| මතුදා | - | කැස්බෑව මහ නගර සභාව |

**කැස්බෑව ගමේ ආණ්ඩුව**

© **කඳන ආරච්චිගේ තිලකරත්න**
දුරකථන 071 4858612

**පළමු වැනි මුද්‍රණය 2019 සැප්තැම්බර් 06**

පිටු සැකසුම සහ කවර නිර්මාණය
එම්. කේ. එල්. ජයලත්
දුරකථන : 071 9022270

මුද්‍රණය
ඉමාෂි පින්ටර්ස්,
96ඒ, වනාත පාර, ගංගොඩවිල, නුගේගොඩ.

ප්‍රකාශනය
කැස්බෑව නගර සභාව

# ගරු සභාපතිතුමාගේ පණිවුඩය



ශ්‍රී ලංකාව, පරසතුරු රජවරුන්ගෙන් මෙන්ම ප්‍රාන්ත රජවරුන්ගෙන් ද මුදාගෙන රට එක්සේසත් කළ හය වන පැරකුම්බා රජ දවස සිට එන, කැස්බෑව ප්‍රාදේශීය ආණ්ඩුකරණය තුළ මාම්පේ කැස්බෑව ගම් කාර්ය සභාවේ සිට අද දක්වා විකාශය පිළිබඳව වර්ථමාන පරපුරට කරුණු හැදෑරීමටත්, කැස්බෑව ප්‍රාදේශීය සභාව සහ වත්මන් කැස්බෑව නගර සභාව දක්වා කාලය තුළ ජනතා ස්වාධිපත්‍ය මත තේරී පත් වූ ගෞරවනීය මහජන නියෝජිතයින් හඳුනාගැනීමටත්, ඔවුන් කැපවීමෙන් ගොඩනැගූ වර්තමානය දක්වා ඉටු කළ කාර්යභාරය අගයනු පිණිස මෙම ග්‍රන්ථය සම්පාදනය වී තිබේ. කැස්බෑව ගමේ ආණ්ඩුව - එදා - මෙදා - මතුදා මැයෙන් වූ මෙම කෘතිය 2019 වර්ෂයේ සාහිත්‍ය මාසය වෙනුවෙන් සැප්තැම්බර් 06 සහ 07 දෙදින පවත්වනු ලබන ''සාහිත සංකලන මහෝත්සවයේදී'' දොරට වැඩීම සිදුවේ.

ඒ සඳහා මාගේ ආරාධනයෙන් මෙහි ලේඛන කටයුතු කළ කැස්බෑව හිටපු ප්‍රාදේශීය ලේකම්වරයකු මෙන්ම විශේෂ කොමසාරිස්වරයකු වූ කඳනාරච්චිගේ තිලකරත්න මහතාට මාගේ ගෞරවනීය ස්තුතිය පුද කරමි. එමෙන්ම මෙම කාර්යය සඳහා දායකත්වය ලබාදුන් නගර සභාවේ ලේකම් කේ. තරංගා ගම්ලත් මහත්මිය සහ සංවර්ධන නිලධාරි මධූෂා හර්ෂණී මහත්මිය මෙහිලා සිහිපත් කරමි.

මෑත කාලීනව පියදාස ලියනගේ මහතා ලියූ කැස්බෑව කෘතියත්, ඉන්දික මංජුල පෝරගේ මහතා ලියූ අපේ ගම බටකැත්තර කෘතියත්, අනිල් ප්‍රියරත්න ලියූ අපේ ලේඛකයෝ කෘතියත් කැස්බෑව පිළිබඳව විවිධ ක්ෂේත්‍රයන් හා පැතිකඩයන් ඔස්සේ ලියවී ඇතත් පළාත් පාලන ඉතිහාසය හා ප්‍රාදේශීය දේශපාලන ඉතිහාසය පිළිබඳව කිසිවකුගේ අවධානය ඊට යොමු නොවීමෙන් එම අඩුව පිරවීමට මාහට සිත්වීම පිළිබඳව අතිශයෙන් සතුටට පත්වෙමි.

කැස්බෑව ප්‍රාදේශීය පරිපාලනය මෙන්ම කැස්බෑව ප්‍රාදේශීය ආණ්ඩුකරණය ද මහජන සේවාවන් සැලසීමේලා එක සේ වැදගත්කමක් උසුලයි.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත අනුව 1991 වර්ෂයේ මහජන නියෝජිතයින් තේරී පත් වූ කැස්බෑව ප්‍රාදේශීය සභාව වසර 15කට පසුව 2006 අප්‍රේල් මාසයේදී බොරලැස්ගමුව හා කැස්බෑව නගර සභා වශයෙන් පරිපාලන ව්‍යුහ දෙකක් ලෙස උත්ශ්‍රේණිගත කර සංස්ථාපනය කරන ලදී. ඒ, මෙම පරිපාලන නගරවලට ජනතාව ඉතා සීග්‍රයෙන් ඇදී ඒම මත වේගයෙන් සංවර්ධනය වීම නිසාවෙනි. එයින් වසර 13ක් ගත වූ අද දින ඉතා ජනාකීර්ණ නගර බවට පත් වී ඇති මෙම බලප්‍රදේශ තවත් අවුරුදු 5ක් වැනි කෙටි කලකදී මහ නගර සභාවක් දක්වා උත්ශ්‍රේණිගත වීම අපේක්ෂා කළ හැකිය. ඒ සඳහා දැනටමත් මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් පිළියන්දල වානිජ නගරයක් සහ කැස්බෑව පරිපාලන නගරය ලෙසත් සංවර්ධනය කිරීමට යෝජිත අතර අපද ඒ අනුව කැස්බෑව වැවට මුහුණලා පවතින කැස්බෑව ප්‍රාදේශීය සභාව නියෝජනය කළ මහජන නියෝජිතයන් රැස්වූ බිමට ''**යෝජිත ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල**'' රැගෙන නොබෝ දිනකින් අක්මුල් සොයා පැමිණෙන්නෙමු.

ආණ්ඩුවේ ඒජන්තවරුන්ගේ දිනපොත් සහ ශ්‍රී ලංකා පරිපාලන වාර්තාවල සඳහන් තොරතුරු පරිදි බස්නාහිර පළාතේ ඒජනත්වරයා වූ ජේ. පී. ප්‍රේෂර් මහතා 1916.11.08 දින දිවා ආහාරය ලබාගත් කැස්බෑව තානායම එහි වූ අගයන් ඒ අයුරින්ම සුරක්ෂිත කරමින් නව මුහුණුවරකින් ජනතා අයිතියට භාර කිරීමට ද නියමිතය.

6 වන පැරකුම්බා රජු බැහැ දැකීමට දෙමළ රජ පරදා ජයගෙන පැමිණි සපුමල් කුමරු කෙස් බෑ ස්ථානය කැස්බෑවත්, ස්නානය කර රෙදි පිළි ඇඳි පිළියන්දල මෙම ඓතිහාසික භූමියේ ප්‍රාදේශීය ආණ්ඩුකරණ විකාශය තුළ වර්තමාන කැස්බෑව නගර සභාව පාලනය කරනු ලබන එහි සභාපතිවරයා වශයෙන් මං සලකුණු තබමින් අභිමානවත් අතීතයට එක් වෙමින් ද මහ නගරයක අනාගත ආශ්චර්ය දකිමින් ද පියවර තබන්නෙමි.

මෙම අතිමහත් කාර්යභාරයේදී අපගේ මෙන්ම කැස්බෑවේ ද දේශපාලන නියමුවා හා පන්නරය වන හිටපු අමාත්‍ය සහ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ගාමිණී ලොකුගේ මැතිතුමාගෙන් ලැබෙන සහය මෙහිදී ගෞරව පූර්වකව සිහිපත් කරමි.

**ලක්ෂ්මන් පෙරේරා**


**ගරු සභාපති - කැස්බෑව නගර සභාව**

**2019.09.06**

# කැස්බෑව ගමේ ආණ්ඩුවෙහි මුලසුන



ගාමිණී තිලකසිරි මැතිතුමා
1991-1993



ආර්.එම්. සුසිල් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා
1993-1997



කේ. ගාමිණී ද සිල්වා මැතිතුමා
1997-2002



ටී.ඒ.ඩී. ආරියදාස මැතිතුමා
2002-2006



පී.ඩී.එල්. ලෙනාඩ් කරුණාරත්න මැතිතුමා
2006-2010



ලක්ෂ්මන් පෙරේරා මැතිතුමා
2011-2013



සුමන විවියන් රණවීර මැතිතුමා
2013-2015



ලක්ෂ්මන් පෙරේරා මැතිතුමා
2018 සිට මේ දක්වා

# හැඳින්වීම

කැස්බෑව නගර සභාවේ සාහිත්‍ය උත්සවයට සමගාමීව කැස්බෑව ගමේ ආණ්ඩුව - එදා - මෙදා - මතුදා නමින් පරිච්ඡේද හතරකින් යුතු පොත් පිංචක් එළිදැක්වීම කාලීන අවශ්‍යතාවයක් ඉටු කිරීමකි. අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිතුමාගේ උපදේශකත්වය මත වත්මන් සභාපතිතුමාගේ කැස්බෑව නගර සභාවේ අනාගත අපේක්ෂා ඉටුකරගැනීම උදෙසා මෙය යහපත් ප්‍රවේශයක් වනු ඇත.

මෙහි පළමු පරිච්ඡේදය කියවන විටම අපට හැඟී යනුයේ කැස්බෑව නගර සභා බල ප්‍රදේශයේ ජීවත්වීමම අපට කෙතරම් අභිමානයක් ද යන්නයි. එසේම කැස්බෑව ඉතිහාසය පිළිබඳව පර්යේෂණ කරන්නෙකුට ඉතා අගනා මග පෙන්වීමක් ද මෙම ග්‍රන්ථයෙන් කර ඇති අතර අධ්‍යාපනය ලබන ශිෂ්‍ය ප්‍රජාවට ද වැදගත් කරුණු විශාල ප්‍රමාණයක් රැස් කර දී ඇත.

දෙවන, තෙවන, සිවුවන පරිච්ඡේදවලින් පළාත් පාලන ක්‍රමයේ ක්‍රමික විකාශනයත් ඒ හා බැඳුණු රාජ්‍ය නියමයන් පිළිබඳවත් කරුණු රාශියක් ගොනු කර ඇත.

මෙම පොත කුඩා එකක් වුවත් වැඩිදුර අධ්‍යයනය කරන අයකුට එය කදිම අත්වැලක් වන බව සඳහන් කරනු කැමැත්තෙමි. කේ. ඒ. තිලකරත්න නම් වූ මෙහි රචකයා කීර්තිමත් පරිපාලන නිලධාරියෙකු මෙන්ම වත්මන් ජාතික පොලිස් කොමිෂන් සභාවේ විමර්ශන අධ්‍යක්ෂක වරයාද වන අතර කැස්බෑව නගර සභා බල ප්‍රදේශයේ සම්මානිත පුරවැසියකු ද වේ. මෙම කාර්ය පිළිබඳව සටහන් තැබීමට මා වෙතම පැවරීම පිළිබඳව කැස්බෑව නගර සභාවේ සභාපති ලක්ෂ්මන් පෙරේරා මැතිතුමා ඇතුළු සියලුදෙනාටම මාගේ කෘතඥතාවය ප්‍රකාශ කර සිටිමි.

**ශාස්ත්‍රවේදී ශ්‍රී සෝමානන්ද අඹේවෙල පඤ්ඤාසාරාභිධාන මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ**

(කැප්පෙටිපොල සුභද්‍රාරාමය, පිළියන්දල, බුද්ධාලෝක යන උභය මහා විහාරාධිපති ස්‍යාමොපාලි වංශික මහා නිකායේ ඌව පාර්ශවයේ) මහා නායක, ශ්‍රී සද්ධර්ම භාරතීශ්වරාචාර්ය මහා මහොපාධ්‍යාය අග්ගමහා සද්ධම්ම ජෝතික ධජ පණ්ඩිත සමස්ත ලංකා සාම විනිසුරු

# කැස්බෑව ඓතිහාසික තොරතුරු 1

කැස්බෑව පිළිබඳව ගොඩ නැගී ඇති ජනප්‍රවාද මෙන්ම ලිඛිත තොරතුර එතරම් සුලබ නැත. ඇති තොරතුරු පිළිබඳව ද ඒකග්‍රතාවයක් ද නැත.

6 වැනි පැරකුම්බා රජු ශ්‍රී ලංකාව පර සතුරු රජවරුන්ගෙන් මෙන් ම ප්‍රාන්ත රජවරුන්ගෙන් මුදා ගෙන එක් සේසත් කළේ ය. එසේ කිරීමේ දී සපුමල් කුමාරයා යාපා පටුනට සේනා සමඟ සටනට යැවූහ. ඔහු දෙමළ රජ පරදා ජයගෙන පැමිණියේ ය. ඔහු මහ රජු බැහැ දැකීමට යාම සඳහා පිටත් වන්නට පළමුව කෙස් බා දැලි රැවුල් කපා ස්නානය කොට ආභරණ රෙදි පිළි, ඇඳ පැළඳ සූදානම් වූහ. ඒ තැන් ඒ ඒ නමින් ප්‍රචලිත වූ බවය ජනප්‍රවාදවල එන්නේ.

කෙස් බෑ තැන ''කෙස් බෑ'' ''කැස්බෑව'' වූ බවත්, පිළි ඇඳි හල ''පිළියන්දල'' වූ බවත් ජනප්‍රවාදයේ පැවතෙයි. එමෙන්ම මේ කැස්බෑව පිළිබඳ තවත් අදහසක් ද ඇත. පරාක්‍රමබාහු මහ රජතුමා ජන ක්‍රීඩා කිරීම සඳහාත් ,ස්නානය කිරීම සඳහාත් පැමිණි 'පිණිදියාගාර' නමින් හැඳින් වූ පොකුණින් නෑමට පෙර කෙස් කපා සූදානම් වූ බවත් කෙස් - බෑ තැන, කැස්බෑව නමින් හැඳින් වූ බවත්, විශ්වාස කරත්. මේ සඳහා විශ්වාසය තහවුරු කිරීම පිණිස අදත් පිණිදියාගාරය නමින් හඳුන්වන දිය බුබුලක් මාම්පේ ගමේ දකින්නට ඇති බව පෙන්වයි. විදේශිකයින් වරක් මෙම පොකුණ වැසීම සඳහා ගොරක කොට දමා ඇතුන් ලවා

පාගවා ඇතත් අද ද මේ දක්වා ම එහි සදා කල් ජලයෙන් පිරී නොසිඳී පවතියි. පැරැන්නෝ මෙසේ විශ්වාස කරත්, කෙසේ වෙතත් මෙම 'කෙස් බෑ' තැන ''කැස්බෑව'' වූවයි යන අරුතට විරුද්ධ ව සංවාදයක් ද නැත.

එහෙත් සිංහල විශ්ව කෝෂයේ 7 වැනි කාණ්ඩයේ පළමු කලාපය කැස්බෑව යන්න විස්තර කර ඇත්තේ මීට ඉඳුරා ම වෙනස් අදහසක් දනවන අන්දමටය.

කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළයේ පල්ලෙ පත්තුවට අයත් කැස්බෑව කුඩා නගරයකි. කොළඹ - හොරණ මහා මාර්ග යේ 13 වන සැතපුම් කණුව අසල පිහිටා ඇති වැව වර්ග සැතැපුමක් පමණ විශාල වන බවත් මෙම වැවේ කැස්බෑවුන් ජීවත්වූ නිසාත්, මෙම වැව කැස්බුවෙකු ගේ හැඩය ගත් නිසාත්, ජනප්‍රවාදවල මෙම වැව කැස්බෑව වැව වූ බවත් ඒ නිසාම මෙම ප්‍රදේශයට කැස්බෑව යන නම ව්‍යවහාර කළ බවත් සඳහන් වේ.

මෙම වැවට අතීතයේ බෙල්ලන්විල ඔස්සේ බොල්ගොඩ ගඟට සම්බන්ධව තිබුණ කටු ඇල නිසා මුහුදේ සිට කැස්බෑවන් එන්නට ඇතැයි සමහරු විශ්වාස කරති. කෙසේ වෙතත් කැස්බෑව යන්න ඉතා මෑතකදී සම්බන්ධ වූ නමක් බවත් පෙර මෙම ප්‍රදේශය හඳුන්වා ඇත්තේ ''දෙමළදූව'' යනුවෙන් බවත් අදහස් වේ. සපුමල් කුමාරයාට පවරා දී ඇති නින්ද ගම් පිළිබඳ ව ඇති ''දෙමළ දූව සන්නසින්'' මේ බව පැහැදිලි වන බව පෙනෙන්නට ඇත. මෙහි ඉදිරියේ දක්වා ඇති දෙමළදූව සන්නස හා මාම්පේ සන්නසේ එම තොරතුරු පැහැදිලිව දක්නට ඇත.

කැස්බෑව ආසනයේ තොරතුරු හෙළි කරන සන්නස් කිහිපයකි.

## 1. වැල්ලමිල්ලේ පුවරු ලිපිය

මෙම පුවරු ලිපිය විනාශ වී කැබලිවලට කැඩී ගොස් ඇත. එහි බිඳුණ කොටස් එකතු කොට කෞතුකාගාරයේ තැන්පත් කොට තිබේ. මෙම පුවරු ලිපියෙන් සල්පිටි කෝරළයේ පැරණි

මායිම් පිළිබඳ දළ අදහසක් ලැබේ. මෙම පුවරු ලිපියේ සඳහන් ''පනත් බුණු දනවිය'' යන්න සල්පිටි කෝරළයත්, රයිගම් කොරළයත් එකතුව සෑදුන ප්‍රදේශයක් බව බොහෝ දෙනාගේ අදහස ය. අදත් කළු ගඟේ මෙසේ දෙබෑ වූ ගලක් දක්නට ඇත. මෙම ගල එදා සල්පිටි කෝරළයෙන් රයිගම් කෝරළයත් වෙන් කළ ගල ලෙස සලකන්නට ඇත.

## 2. මාම්පේ සන්නස

එදා සන්නසෙහි 'මාම්බේ' යනුවෙන් යොදා ඇත්තේ අද මාම්පේ ග්‍රාමයයි. මෙම සන්නසින් ශ්‍රී දළදා වහන්සේ ආරක්ෂා කිරීමට සෙම්බගප්පෙරුමාල් නැත්නම් සපුමල් කුමාරයාට නින්ද ගම් වශයෙන් vii වැනි බුවනෙක බාහු මහ රජතුමා තෑගි කර දුන් බව ඔප්පු වේ. මෙම නින්ද ගමෙහි හතර මායිම් ද ඉර හඳ පවතිනාතාක් කල් වලංගු වන බව ද සඳහන් කර ඇත. මාම්පේ ගනේවත්ත දේවාලය එදා පටන් ඉතා වැදගත් සකල ජනයාගේ වැඳුම් පිඳුම් ලැබූ ගෞරව සම්මාන ලැබූ පූජා බිමක් බව සඳහන් වේ. එමෙන්ම මෙහි එන කෝරළ කරන්නන්, අතු කෝරළයින් යනුවෙන් පැරණි තනතුරු සඳහන් ව තිබීම ද වැදගත් සාධකයකි. එමෙන්ම පැරණි නින්දගම් ලබා දී ඇත්තේ ඉර හඳ පවතින තාක් කල් යනුවෙනි. විශේෂයෙන් සතර මායිම් දැක්වීමේ දී පිළියන්දල මකුළුදූව වැනි ග්‍රාම නාම සඳහන් වේ.

## 3. දෙමළදූව සන්නස

මෙම සන්නසද බොහෝ දුරට මාම්පේ සන්නසට සමානය. මෙම තඹ පතින් vii වන බුවෙනකබාහු රජතුමා මාම්පේ විජයරාජ පලිහවඩන සෙම්බගප්පෙරමාල් කුමරු හෙවත් සපුමල් කුමාරයාගේ රාජපාක්ෂික භාවයටත් දළදා වහන්සේගේ ආරක්ෂක හා ආවතේව කිරීම් සඳහාත් පැවරූ නින්ද ගමක් ලෙස සැලකේ. මෙම තඹ පතින් දැක්වෙන දෙමළදූව අද කැස්බෑව වැව පිහිටි ප්‍රදේශය බව හඳුනාගෙන ඇත.

කැස්බෑව ප්‍රදේශයේ සෙල්ලිපි, ටැම්ලිපි, පුවරු ලිපි, තඹ සන්නස් වැඩිපුර දක්නට නොලැබේ. බොහෝ විට මෙසේ

සෙල්ලිපි තඹ සන්නස් දක්නට ඇත්තේ වෙහෙර විහාර සඳහා නින්දගම් පවරා දීමේදී එම අයිතිය ඉරහඳ පවතිනා තාක් කල් පැවතිය යුතුය යන අදහස් නිසාය. පැපිලියානේ සුනේත්‍රාදේවී පිරිවෙනෙහි ඇති සෙල් ලිපිය ද කැබලිවලට කැඩී ගොස්ය.

- පහත්භානු දනවිය -

*වැල්මිල්ලේ පුවරු ලිපියේ දක්නට ලැබෙන වැකියකි. මින් අදහස් කරනුයේ පහණ බුණු කෝරළය යනුයි. අද සල්පිටි කෝරලය හා රයිගම කෝරලය එකතුව එකල පහණ බුණු කෝරළය සැදී ඇත. අද දක්වා කලු ගඟේ පැලුණු ගලක් දක්නට ඇත. ඒ ගල දෙපස ප්‍රදේශය පහණ බුණ රට ලෙස හැඳින්නූ බව බොහෝ දෙනා විශ්වාස කරති. මෙනිසා සල්පිටි කෝරළය එදා ගඟේ පැලුණ ගලට මායිව පිහිටා ඇත.*

- සන්නස නො. 1 මාම්පේ -

*ස්වස්ති ශ්‍රී සූර්යවංශොත්භූත සුමිත්‍රරාජ පුත්‍ර පවිත්‍ර ගොත්‍රාභිජාන ත්‍රී සිංහලාධිස්වර නවරත්නාධිපති ශ්‍රීමත් ශ්‍රී සඟබෝසශ්‍රී භුවනකබාහු චක්‍රවර්ත ස්වාමින් වහන්සේට තුන්වන්නෙන් මතු අවුරුඩු වෙසඟපුර පුහලොස්වක මාම්බේ සෙම්බගප්පෙරුමාල් සොඳින් ඒකාන්ත පක්ෂ වෙලා දුක ගැන ගෙන ආ හෙයින් සල්පිටිකෝරලේ මාම්බේ කියන ගමට හිමි නැගෙනහිරින් පිනිදිය ආගාරෙ බක්මීගහ හා මෙසේම අළුත්ගෙයිවත්ථෙ උඩුගල් පොත්ත හා දකුණු දිගින් ගඩබුවනේ ගල්පොත්ථ හා මෙසේම පිලින්දෙළෙ වැනියෙර හා බස්නාහිර ගොරියානෙ වත්ථ හා උතුරු දිගින් කල්බොපිටියගෙයි වත්ථෙ දෙල්ගහ හා මකුළුඹුවේ මීගහකුඹුරේ වැනියර හා මෙකී හතර මායිමට ඇතුලත් වූ මෙහි බද ගම් මුදල් ගෙවන ගස කොළ කුඹුරු ඕවිටිවල් විල් මේ ආදී වා තැන් පටන් ශ්‍රී ධන්ත ධාතූන් වහන්සේ සන්තක කොට අවුරුදු එකකට පනම් දහයක් පඬරට දී ප්‍රයෝජන විඳිනා නියායෙන් මාම්බෙ සෙබිහප්පෙරුමාල හා මෙකුගේ දරු මුනුබුරු පරම්පරාවට අවන්ද්‍රාක්කර්කස්ථායිව ස්වස්තිරව පවතිනා ලෙසට සලස්වා කොරල කරන්නන් අතුකොරලයින් යන එන හේවාපලයන් බහුවිධානයන් නොකියන නොකරන නියෝන් නියමකල ජයඩන කොට්ටෙ චිත්‍රකූට මණ්ඩපයෙහි මකර තොරණන ධවලන පත්‍රයෙන් සමලංක්‍රිතවූ සිංහාසනයෙ ඇමතිගත දෙවින්ද්‍ර විලාශයෙන් වැඩහිඳ වදහල මෙවරින් මේ සන්නස් තදන පත්‍රය ලියාදුන් බවට සන්නස් නිරුවරහප්පෙරුමලුහම ධර්මය වර්ධනය කරන්නෙ ඉරහඳ පවතිනාකල්...*

ජාතික කෞතුකාගාරනේ උපුටා ගැනිණි.

## ~ සන්නස නො. 01 දෙමළදූව ~

*ස්වස්ති ශ්‍රී වෛවස්වත මනු සංඛ්‍යාත මඟ සම්මත පරම්පරානුයාත සූර්ය වංශෝත්භූත සුමිත්‍ර රාජපුත්‍රපවිත්‍ර ගොත්‍රභිජාත මහා රාජාධිරාජ ත්‍රි සිංහලාධිශ්වර නවරත්නාධිපති ශ්‍රීමත් සිරිසඟබෝ ශ්‍රී සලකකලා සාහිත්‍ය පණ්ඩිත භුවනෙකබාහු චක්‍රවර්ති ස්වාමින්වහන්සේට නවවන්නෙත් මතු අවුරුදු වෙසඟ පුර සතවක මාම්පේ විජයරාජ පලිහවඩන ශෙඛනප්පෙරුමාලා වැඩ උන්තැන අදහසට ඒකාන්ත පක්ෂව දුක්පල ගැන සොඳින් පැවතිලි නිසා මෙකින්නන්ට පළමු පටන් ප්‍රවේණිව පැවත ආ සල්පිටි කෝර්ළය බඳ දෙමළදූව යයි යන ගමට හිම් නැගෙනහිරින් මාදිත්තර වෙල්මැද හා දකුණු දිගින් රුක් කුමාරයා වත්තේ අගලපිට අඹගහ හා බස්නාහිරින් ගැඩබුවානේ ගල්පොත්තේ හා උතුරු දිගින් මාම්පේ ගල්පොත්ත හා මෙකියන සතර මාහිම්ට ඇතුලත් වූ මෙහි බද ගම් මුදල ගස කොලවල් විල් කුඹුරු ඕවිට මේ ආදී ශ්‍රී දන්ත ධාතුන් වහන්සේ සන්තක කොටපුදව අවුරුදු එකකට පඩුරට පනම් පසක් දී ප්‍රයෝජන විඳිනා නියායෙන් මෙකියන මාම්පෙ විජය රාජ පිළිහවඩන ශෙඹග ප්පෙරුමාලාට හා මෙකුගෙදර මුණුබුරු පරම්පරාවට ආ චන්ද්‍රක්කර්කස්ථායිව ස්වස්තිරව පවත්වා පනතට සලස්වා පත්ලියා දෙන්නෙයයි මීට අනුහස වූ කෙනෙක් ඇතැම් සංජීවකාල සුත්‍රාදී අටමහ නරකයෙහි පැසී ගොඩ නොදුටුවානම් වෙති. මීට මතු සහයෙව බලෙලා නිලලාදුන් කෙනෙක් ඇත්නම් මතු මයිත්‍රී හුදුන් දැක ඒ ශාසනයෙහි මහනව රහත්ව අමාමහ නිවන් දකිති කියා වදාරා ජයවර්දන කෝට්ඨාශයෙ මාගිලාවෙහි විචිත්‍ර චිත්‍ර කර්මාන්තයෙන් විරාජමාන වූ සිංහාසනයෙහි වැඩහිඳ සකල නගරාගනයෙහි වූ මුදලිවරුන් මැද වදළ මෙවෙරින් මේ සන්නස් තාවු පත්‍රය ලියා දුන් බවට සන්නස තීරුව රංගනපෙරුමාළු මහ ධර්මය වර්ධනය කරතෙයි.*

ජාතික කෞතුකාගාරනේ උපුටා ගැනිණි.

කැස්බෑව, කෝට්ටේ රාජධානි සමයේ රජවාසලට අවශ්‍ය සේවාවන් සපයන ලද ගම්මාන රාශියකින් සමන්විත විය. ඒ ඒ ග්‍රාම නාම පටබැඳ ඇත්තේද එම තත්ත්වය හේතුවෙනි. රාජවාසලට රෙදිපිළි සපයා ඇත්තේ පිළිගෙදරින්ය. පිළිගෙදර පසුව පළීගෙදර වූ බව සඳහන්වේ. එමෙන්ම නාම්පමුණුව ගමට එම නම හිමිවූයේ රජවාසලේ රජකුමර කුමරියන්ට ස්නානය සඳහා නානු සැපයිය යුතුව තිබුණු හෙයිනි. රජවාසලට බත සැපයූ මා වී පැහුණු යාය පිහිටා තිබුණේ කැස්බෑවෙහිය. මා+වී+ඉත්තර පසුව මාවිත්තර වී ඇත. මාළිගාවට ජලය, පැන්

හෙවත් පිණිදිය සපයන ලද්දේ පිණිදිය ආරෙනි. පිණිදිය ආර යනුවෙන් අද දක්වා ඇති පොකුණු පිහිටා ඇති හේතුවෙන් එම පෙදෙස පිණිදියාගාරය විය. එමෙන්ම යාගහෝම පැවැත්වූ කාලි+අම්මා+මහර කාලියම්මහරද, රත්මල් වලින් ගහන දෙනිය රත්මල්දෙණියද, වැව ගොඩ වූ පසු වැවේ මැද වල පමණක් ඉතිරි වූ පසුව වැවේවල යන්න වෑවල, මාදම්, හිඹුටු, බෝවිටියා, කරඹ වැනි කැළෑ පලතුරු ළඳු කැළෑවලින් පිරී පෙදෙසෙහි දම් ගස්වලින් ගහණපිටිය දම්+පේ හෙවත් දම්පේ යනුවෙන්ද හල්ගස් බහුලව පැවතීම හල්පිට සේ ගම හැඳින්වීමටද හේතු වී තිබේ. බෝකුන්දර ගමට එම නම පටබැඳුනේ බෝ+තුන+දොර හේතුකොටගෙන බවද සුවාරපොළ මුල් කාලයේදී සිව්වාර පොළ ලෙස හැඳින්වීමද, ජන ප්‍රවාදයේ සටහනකි. කෝට්ටේ යුගයේ ඇතැම් කුමාරවරුන් බලසේනා රහසේ රැස්කර සතුරා සමග සටනට ගොස් තිබුණි. එනිසාම බල+රැස්+ගම පසුව ව්‍යවහාරයේදී බොරලැස්ගමුව විය. කෝට්ටේ රයිගම රාජධානිවලට ඔබ මොබ යන අය ගිමන් හැරීමට බටු - නැත්නම් පැමිණ නැවත යන ස්ථානය බටු+යන+දොර පසුව බටුවන්දර බවට පත් වී ඇත. කැස්බෑව ආසනයේ පිහිටි කිරිගම්පමුණුවේ ගම්වාසීන් විසින් රජවාසලට කිරි සපයා ඇත. බ්‍රාහ්මණයන් පදිංචිව සිටි ස්ථානය බ්‍රාග්මණගම වශයෙන්ද හඳුන්වා ඇත.

කැස්බෑවෙහි සුවිශේෂිත වූ ඓතිහාසික ස්ථාන ගණනාවකි.

## 1. ගනේවත්ත දේවාලය

කෝට්ටේ රජකළ 7 වන බුවනෙකබාහු රජතුමා මේ ප්‍රදේශයේ සැඟවී සිටි බවද ඔහු විසින් ගනේවත්ත දේවාලය ආරම්භ කළ බවද එමෙන්ම වන්දනා මාන කිරීමට දේවාලයට පැමිණි බවද ඉතිහාසයේ සඳහන් වේ. පිළියන්දල නගරයට ආසන්නයේ නගර සභා සීමාව තුළ පිහිටි මෙම දේවාලයෙන් අදටත් පැරණි ගල් කුලුණු හා ගල්පඩි දක්නට ලැබේ. එමෙන්ම අහස උසට නැගුණු බුලු ගස් දෙක අදත් දිස්වේ. එදවස සපුමල් කුමාරයා දේවාලයට පැමිණ මී අඹගස් සෙවනේ රැඳී සිට

විධාව සන්සිඳවා පිණිදියගාරයට ගොස් ස්නානය කළ බවද ආදී කැස්බෑව ජනතාව පිළිගනිත්. එදා දේවාලය ඇරඹීමෙන් පසුව කෝට්ටේ රාජධානියේ සිට පවුල් හයක් ගෙන්වා පදිංචි කර දේවාලයේ පුද පූජා සත්කාර කරන්නට පවරා ඇත. මෙම දේවාලයේ විෂ්ණු, දැඩිමුණ්ඩ, සූනියම්, ගනේශ්වර, විභීෂණ යන දෙවියන් වෙනුවෙන් දේවාලද පිහිටුවා ඇත. මෙම දේවාලය දේශපාලන ජයග්‍රහණයන්ගේ පෙර නිමිත්තක් වශයෙන් ද පිළිගැනේ. 1970 දශකයේදී සෝමවීර චන්ද්‍රසිරි ශූරීන් මෙම දේවාලය ප්‍රතිසංස්කරණයකොට ඊට සුවිශේෂී වැදගත් කමක් ලබාදී තිබේ. 1950 දශකෙය්දී ආරම්භ කළ ගනේවත්ත දේවාල පෙරහැර වර්තමානය දක්වාම ප්‍රදේශයේ දේශපාලන අධිකාරියේදී ද සහාය ලවා අඛණ්ඩව පැවැත්වීම ඉතා වටිනා චාරිත්‍රයක් බවට පත්ව තිබේ.

**2. පිණිදියාගාර පොකුණ**

පිළියන්දල නැගෙනහිර මාම්පේ පිණිදියාගාර මාවත යනුවෙන් අදත් හඳුන්වන පාරක් ඇත. ඒ ආසන්නයේ වෙල් යායේ අදත් දක්නට ඇති කිසිදා ජල නොසිඳෙන දිය බුබුලක් මෙහි ඇත. දියපාර ආරම්භ වන්නේ බොහෝ දෙනාගේ අදහසට අනුව පිණිදියාගාර දිය බුබුලෙනි. මෙම දිය බුබුල අධිරාජ්‍යවාදී පාලකයන් එකල ගොරක කඳන් දමා ඇතුන් ලවා පාගා වැනසීමට මහන්සි ගත්තද එය නැවැත්වීමට නොහැකි වී ඇත.

අදත් දිය ගලා යන නිසා මෙහි ඇති විශ්මය ජනක බව මොනවාට පැහැදිලි වේ. යාපනය ජය ගෙන පැමිණි සපුමල් කුමාරයා මෙම පිණිදියාගාර පොකුණෙන් නා මේ ආසන්නයේ වූ ස්ථානයක සළු පිළි ඇඳ ඇත. එනිසා පිළි හැඳි හල පසුව පිළියන්දල වූවා යන්න අද දක්වා පවතින ජන ප්‍රවාදයකි. එදා රාජ කුමාර කුමාරියන් ජලස්නානය කරමින් ජල ක්‍රීඩා කළ බව සඳහන් වන නිසා එදා විශාල දිය පොකුණක් ලෙස පිණිදියාගාර පොකුණ තිබෙන්නට ඇත. සපුමල් කුමාරයා නොහොත් සෙම්බගල්පෙරුමාල් කුමාරයා දිය නෑවේ ද එදා රජ පවුලේ උදවිය දිය නා ඇත්තේ ද මේ පිණිදියාගාර පොකුණෙන් ය

යන්න පැරන්නන්ගේ මතයයි. දිය නෑමට පෙර සුවඳ කොකුම්, සහිත නානු හිස ගැල්වීම රාජ කුමාරියන්ගේ සිරිතක්ව තිබුණ බවත්. රජමාලිගයට නානු සපයන ලද ගම මේ ආසන්නයේ අදත් නාම්පමුණුව යනුවෙන් හැඳින්වෙන බවත් පැරණි මතයයි.

### 3. සමරකෝන් වළව්ව

වැවල සමරකෝන් වලව්ව වැවල පදිංචිව සිටි දොන් සයිමන් විජේවික්‍රම සමරකෝන් මහතා විසින් තනවන ලද, ඔහුට අයිතිව තිබුණු සුවිසල් දෙමහල් ගොඩනැගිල්ලකි. පිළියන්දල ඔර්ලෝසු කණුව ද ධනවතකු වූ ඔහු විසින් කරවන ලද්දකි.

1881 දී උපන් ඔහුට ජේම්ස්, ජෝන්, ඇල්බර්තිනා, ඩේවිඩ්, පෙඩ්රිකා, රෙබෙකා, පෙට්‍රනෙලා, සලමන්, හෙන්රි, ලුවිස් යන සහෝදර සහෝදරියෝ 10 දෙනෙක් වූහ. ඔහුගේ පියා සල්පිටි කෝරලේ විදානේ ආරච්චිකම (1862) හා මරණ පරීක්ෂක තනතුර ද හිමිව සිටි දොන් කොර්නේලිස් විජයවික්‍රම සමරකෝන් ය. මව දන්දෙනිය වලව්වේ එංගල්තිනා විජයවර්ධන සෙනෙවිරත්නය.

මේ වලව්ව සයිමන් විජේවික්‍රම සමරකෝන් මහතාගේ තුරුණුවියේ දීම එනම් 1905 දී තරම සාදවන්නට පටන් ගත් එකක් යැයි සිතිය හැක. මෙය වසරක් පාසා කාමර එක් කරමින් නිම කරන ලද්දකි.

විශාල විසිත්ත කාමර, නිදන කාමර, කෑම කන කාමර, කාර්යාල කාමර, අමුත්තන් පිළිගන්නා කාමර, මත්පන් හා දුම් පානය සඳහා කාමර, ගබඩා කාමර, කුස්සි ආහාර හා පිඟන් බඩු තබන කාමර (Pantries) නාන කාමර, රියදුරු හා සේවක කාමර, ආලින්ද, ගෘහාභ්‍යන්තර මාර්ග (Corridors) ඇතුළුව කාමර 40ක් මෙහි විය. බිල්ලන් බැඳීමට වෙනම ශාලාවක් ද අශ්ව ගාලක් ද විය. දොර ජනෙල් 120කට වඩා තිබුණි.

බිත්ති එච් අයන් යොදා ශක්තිමත්ව තනා තිබුණි. උඩු මහලට උස මීටර් 2 සෙන්ටි මීටර් 95ක් පමණය. උඩුමහලේ බිත්ති මීටර් 3 1/2 ක් පමණ උසය.

සයිමන් සමරකෝන් සෞන්දර්යය ප්‍රිය කළ කලාකාමියකු මෙන් ම මහේෂාක්‍ය ලීලාවෙන් ජීවත් වූ අයකු බව වලව්වේ නටබුන් දෙස බැලීමෙන් පවා වටහාගත හැක. වලව්වේ දොර ජනෙල් ඉහළින් යොදා ඇති සෘජු ක්‍රෝණාස්‍රාකාර මෙන්ම අඩ කවාකාර මිදි කොළ ලී කැටයම් කලාත්මක වටිනාකමින් යුක්තය. ආලින්ද ගෘහාභ්‍යාන්තර මාර්ග, නාන කාමර, ආදියට යොදා ඇත්තේ විදේශවලින් ගෙන්වන ලද රටා සහිත වර්ණ තාරුකා පිඟන් ගඩොල් හා මතු වූ (embossed) රෝස මල් පිඟන් ගඩොල්ය. දොර ජනෙල් රාමුවේ ගිල්වා (palled) තැනූ ඒවාය. ජනෙල් බොහෝමයක්ම මල් හා සාමාන්‍ය වීදුරු යෙදූ ඒවා විය.

මේ දෙමහල් ගොඩනැගිල්ලේ උඩු මහලේ සඳලු තලයකි. උඩුමහලට නැඟීමට ඇති ලී තරප්පු පෙළ කලාත්මකය. හුරුබුහුටිය. පහසුවෙන් නැගිය හැකිය. දකුණු දිසාවට තරප්පුපේළි 8ක් නැග්ග විට කෙටි විවේකයක් ලැබේ. ඊළඟට උතුරට තරප්පු පේළි 10ක් නැග උඩුමහලට පිවිසිය හැක. එක තරප්පු පතක දිග සෙ.මි. 73කි. උස සෙ.මී. 16 1/2කි. පළල සෙ.මී. 25 1/2කි. ගරාදි පෙළේ උස සෙ.මී. 89කි.

වලව්ව ඉදිරිපිට ටෙනිස් පිටියක්ද කැපූ තණ පිටියක්ද, නෙළුම් පොකුණක් ද විය. ක්‍රීඩා ලෝලී ඔහුට විශාල බිලියඩ් මේසයක් විය.

ඔහුගේ ගෘහ භාණ්ඩ අතර අගනා කැටයමින් යුත් කළුවර කවිච්චි, මේස, පුටු, ටීපෝ, පැද්දෙන පුටු, වේවැල් පුටු ආදිය ද චීන පිඟන් බඩු ද, හැඳි ගැරුප්පු ද රිදී හා පිත්තල භාණ්ඩ ද විසිතුර ලාම්පු ආවරණද විවිධ හැඩයෙන් හා ප්‍රමාණයෙන් යුතු කැටපත් ද රාශියක් තිබුණු අතර ඇත්දල යුගල තුනක් ද විය.

මේ වලව්වේ ඉඩම අක්කර 35කි. වලව්වේ පැරණිකම ඉදිරිපිට අති මීටර් 2 සෙන්ටි මීටර් 70ක් වට ප්‍රමාණය ඇති කස ගස කියාපායි

අවිවාහකව සිටි ඔහු 1954.11.22 දින මිය ගියේය. ඔහු සතුව පැවති ඉඩකඩම් හා වලව්ව මහා භාරකාර දෙපාර්තමේන්තුව යටතේ පවතී.

ගමටත් රටටත් අගනා කෞතුක වස්තුවක් වශයෙන් රැක ගත යුතුව තිබුණු වැවළ සමරකෝන් වලව්ව අද ගරා වැටී පොළොවට වැළලී තිබීම ජාතික අපරාධයකි.

### 4. පිළියන්දල හෝරා ස්තම්භය (ඔරලෝසු කණුව)

පිළියන්දල නගර මධ්‍යයේ සියලු ගොඩනැගිලි අභිබවමින් අහස් කුසට නැගි ඔරලෝසු කණුව රජය මගින් කළ එකක් නොවේ. මෙය වැවල පදිංචිව සිට නැසීගිය කොරනේලිස් විජේවික්‍රම සමරකෝන් මැතිතුමා හා එම මැතිනියට පිං පැමිණවීම සඳහා එම දම්පතීන්ගේ පුත් පරලෝ සැපැත් ඩී. සයිමන් සමරකෝන් මහතා විසින් සාදන ලද්දකි.

අඩි 78ක් උස මෙම කණුවේ පාදම අඩි 16ක් දිග පළලට සාදා ඇත. නිදහස් අධ්‍යාපනයේ නිර්මාතෘ එදා පළාත් පාලන ඇමැති සී. ඩබ්ලිව්. ඩබ්ලිව් කන්නන්ගර මහතා මෙම ඔරලෝසු කණුවට 1952 සැප්තැම්බර් 11 වැනිදා මුල්ගල් තබා ඇත. ගඩොලින් බැඳ ඇති මෙම ඔරලෝසු කණුවේ මුදුණ සනකම කොන්ක්‍රීට් එකකින් සම්බන්ධ කොට මහල් තුනකට සම්බන්ධ වන අන්දමින් නිමවා ඇත. කණුව අභ්‍යන්තරයෙන් උඩටම නැගීමට පඩි පෙළ යොදා තිබීම නිසා ප්‍රතිසංස්කරණ කටයුතුවලට පහසු වී ඇත.

කුළුණේ මුහුණත් හතරේම ඔරලෝසු කටු විවෘතව සාදා ඇති අතර එක විනාඩි කටුවක් අඩි දෙකක් දිගටත් එක පැය කටුවක් අඩි එකහමාරක් දිගටත් සාදා ඇති අතර අඩි හයක් පමණ පළල ඔරලෝසු බට්ටා එල්ලා ඇත්තේ අඩි 5ක් පමණ දිග යකඩ යෂ්ටියකින්ය. මෙතරම් විශාල ඔරලෝසුව ක්‍රියාත්මක කිරීම සඳහා හෝරා යන්ත්‍ර තුනක් යොදා ඇත. සතියකට වරක් එක්වරම මෙම යන්ත්‍ර පණ ගැන්විය යුතුය. මෙම හෝරා යන්ත්‍රයක් අඩි පහක (5) පළල වන අතර අඩි 4ක් උස වේ. මෙම ඔරලෝසු කණුව

මාස 7ක් ඇතුළත සම්පූර්ණයෙන් වැඩ නිමවා 1953 අප්‍රියෙල් මස 30 වැනිදා විවෘත කොට ඇත. වසර 50ක් තිස්සේ ජනතාවට වේලාව හඬනගා කී මෙම ඔරලෝසුව පසු කලක නිශ්ශබ්ද ව සිටි නමුත් පසුව නැවතත් ප්‍රතිසංස්කරණය කර ජනතාව වෙත වේලාව හඬනගා කින්නට පටන් ගෙන තිබේ. විශේෂයෙන් මෙම හෝරා ස්තම්භය රැක ගැනීමේ කටයුත්ත කවදත් ඉටු කළේ තරුණ බෞද්ධ සංගමයත්, එක්සත් රියදුරු සමිතියත්ය. පසුගිය දිනක මෙම අයෝමය අජීවි පුරුෂයා කරණ ලද සත්කාරය මෙනෙහි කොට පිරිත් පිංකමක් පවත්වා සංඝගත දානමය පින්කමක් පවත්වා ඇත. වසර ගණනාව ක්‍රියා විරහිතව පැවතියද 2017 වසරේ පාලන සමයේදී මෙය යථා තත්ත්වයට පත්කර තිබේ.

## 5. බටකැත්තර ගොනා බැඳි දේවාලය

පිළියන්දල මඩපාත පාරේ බටකැත්තර නම් ගමෙහි පිහිටා ඇති මෙම දේවාලය ඓතිහාසික, සිද්ධස්ථානයකි. මෙය කෝට්ටේ යුගයේ රජ කළ 7 වෙනි බුවනෙකබාහු රජතුමා විසින් කරවන ලද දේවාලයක් බව බොහෝ දෙනාගේ පිළිගැනීමයි. රාජ මහාමාත්‍යාදීන් එදා ගමන් බිමන් යාමේදී, ප්‍රදේශයේ රාජ්‍ය පාලන කටයුතුවල නිරත වීමේදී රජුගේ ගැල්වල ගොනුන් බැඳ ඇත්තේ මෙම ස්ථානයේය. මෙම ස්ථානයේ රජුට විශේෂ හාස්කමක් දැනුන නිසා එහි මෙම දේවාලය සැදූ බව ජනප්‍රවාදවල එයි. මේ සඳහා පිළිගත හැකි ඓතිහාසික සාධක රැසකි. කවදාවත් නොසිඳෙන ගලින් ආවරණය වූ රහස් පොකුණ හා ඒ සඳහා බැසීමට ගලින් නෙලන ලද පඩි පෙළක් අදත් අපට දැකිය හැකිය. එමෙන්ම පසුකාලීනව රන් කඩුවක් ඇතුළු රන් ආභරණ රැසක් මෙම ස්ථානයේ තිබී හමුවී ඇත. එමෙන්ම පත්තිනි මෑණියන්ගේ සළඹ මකුළුදූව පුරාණ විහාරයේ දේවාලයට වැඩමවා ගණේවත්ත දේවාලයේ දෙවොල් මඩුවට එදා වැඩමෙව් බව බොහෝ පැරණි අයගේ මතයයි. පොල්ගහකොට්ටනුව නමැති මෙම ආසන්නයේ ඇති ගමෙන් පොල්ගැසීමට ගෙනා පොල් පසුව ඒවා වේලා තෙල් සිඳ දෙවොල්මඩුවට අවශ්‍ය පොල්තෙල් ලබාගෙන ඇත.

ඉතා මනහර දේවාල පෙරහැරක් හා දෙවොල් මඩුවක් එම පරම්පරාගත කපුමහත්වරු වසරක් පාසා ඉටු කරති.

## ආශ්‍රිත ග්‍රන්ථ


- කැස්බෑව - පියදාස ලිනගේ
- පිළින්දල, වැවල විත්ති - සුබෝධි මානව සංවර්ධන මධ්‍යස්ථානය
- බුවනෙකබාහු රජුගේ රාජ්‍ය කාලය - 1521-1551 දක්වා
- අමාවතුර - සෝරත හිමි සංස්කරණය
- ලංකා ගම් වහර
- අපි පිළියන්දල ත්‍රෛමාසික පුවත්පත - පිළියන්දල සිංහල වෙළෙඳ සංගමය
- මාම්පේ සන්නස, දෙමළදූව සන්නස - ජාතික කෞතුකාගාරය
- සිංහල විශ්ව කෝෂය

# පළාත් පාලනය 2

පළාත් පාලනය පිළිබඳව ලංකාවට ඇත්තේ දිගුකාලීන ඉතිහාසයකි. එය ක්‍රි. පූ. 4 වන සියවස තරම් ඈතට දිව යයි. නගර පාලනය උදෙසා නගරගුත්තික ධුරයක් එකල පැවති බවට මහාවංශය සාක්ෂි දරයි. අනුරාධපුර නගරයෙහි නගර ගුත්තිකයකු යටතේ පැවැති අංගසම්පූර්ණ කාර්යක්ෂම පාලන ක්‍රමයක් පැවති බව ඒ අනුව පැහැදිලි වෙයි.

ගම් සභාව යනු ලක්දිව ග්‍රාම පාලනය පිළිබඳව බොහෝ සෙයින් ඉපැරණි අංගයක් විය. අතීතයේදී ගම්සභාව සැදුම් ලද්දේ තලතුනා, සැලකිය යුතු ප්‍රභූ පුද්ගලයන්ගෙනි. ඔවුන් රැස් වූයේ අම්බලමක, විසල් තුරුසෙවණක හෝ වෙනත් පහසු ස්ථානයකය. ගමෙහි සිදුවන සුළු අපරාධ සඳහා දඬුවම් නියම කිරීමත්, ආරවුල් නිරාකරණය කිරීමක් ද එමගින් සිදු විය. ඒ අනුව සොරකම, අඬදබර, කෝලාහල, ණය ගනුදෙනු ආරවුල් ආදිය විසඳන ලද්දේ ගම්සභාව විසිනි. 1818 දී ලංකාවට පැමිණ හමුදා සෙබළෙක්ව සේවය කොට 1842 දී මහාමාර්ග කොමසාරිස් ධුරයට පත් මේජර් තෝමස් ස්කිනර්, ඔහු දුටු ගම්සභා ක්‍රමය විස්තර කරනුයේ මෙසේය.

''ස්වදේශීය ආණ්ඩුවෙහි ගන්සයිබ්'' නැතිනම් ''ගම්සහිබ්'' යනුවෙන් සරල පිහිටුවීමක් තිබේ. මේවා පළමු කොට ඇති වූයේ ඉන්දියාවේ ද, නැතිනම් ලංකාවේද යනුවෙන් පැවැසීමට මට නොහැකිය. වචනයේ පළමු අක්ෂර වලින් කියැවෙන්නේ සිංහලෙන් ගමට කියැවෙන නමයි. දෙවැන්නෙන් කියැවෙන්නේ

හින්දුස්තාන්වලින් ''ස්වාමියා නැතිනම් පාලකයා'' යන්නට කියන නාමයකි. උතුරු ඉන්දියාවේ, බංජාබයේ පැරණි ආණ්ඩුක්‍රමවල මේවා තිබුණු බවට අපි අසා ඇත්තෙමු.

මේ ගම් සභාවල වැඩිහිටියෝ තුන් දෙනෙක් හෝ පස්දෙනෙක් ඇත්තාහ. මොවුන් විශාල ගමකින් හෝ යාබද කුඩා ගම් කීපයකින් සැකැසෙන පිරිසකි. මොවුන් තෝරාගනු ලබන්නේ ගම්මුන් වන සේම, ඔවුන්ගේ රැස්වීම් ආදි සියලු කටයුතු සිදු කෙරෙන්නේ ගමේ තිබුණු සැලකිය යුතු අතුපතර විහිදුණු විශාල ගසක් යටදීය.

මේ ගම්සභාවලට ලැබී ඇති බලතල කොයි කාලයකදී සිට පැවතෙන එකක් දැයි මම නොදනිමි. එහෙත් සුළු සුළු ආරවුල් ඈත ගම්බද දිස්ත්‍රික්කවල අඩු කිරීමට ඒවා සමත් වී තිබේ. දබර සහ ආරවුල් ඒවා සිදුවුණු තැන්වලදී මෙය සිදුකරන නිසා කලින් අරමුණු කරගත් බොරු දිවුරුම් ආදී දේවලට මෙහි දී ඉඩක් නොලැබේ. සෑම සිදුවීම් දහයකින් නවයක තීරණවලට කෝලාහලයකට මැදි වූ පක්ෂ එකඟ වෙන බව මට කීමට පිළිවන. එහෙත් මෙවැන්නකදී වුව ඕන පිරිසකගේ කෙනෙකුට තම නඩුව ඉහළ උසාවියකට ඉදිරිපත් කිරීමට ඉඩකඩ තිබේ. එහෙත්, නඩුව විභාග කිරීම පළමුව ගමේ වැඩිහිටියන් ඉදිරියේ සිදු වුණු බැවින් බොහෝ අවස්ථාවලදී කිසිවකුට කලින් සැළසුම් කරන ලද බොරු සාක්ෂි ඉදිරිපත් කිරීමට ඉඩකඩක් නොලැබී යයි.

ගම් සභාවල කටයුතු මෙසේ අමුතු ක්‍රියාකාරිත්වයකින් සිදු වෙද්දී, ඔවුනට නාගරික ශාලා වැනි දෙයක් ඉදිකර දිය යුතු වේ. ඔවුන්ට ඒවායෙහි තම කාර්යයන්ගේ අත්තිවාරම දමා ගැනීමට හැකි වේ. සුදුසුකම්, තෝරා ගැනීම් සහ ක්‍රියාකාරිත්වයන් ලෙහෙසියෙන්ම කළ හැකි වේ.

මේ කරුණු මෙසේ සිදු වෙද්දී, සෑම පළාතකම, දිස්ත්‍රික්කයකම සහ ගමකම සිටින්නා වූ නායකයන්ගේ ප්‍රමාණය කාර්යයන් සහ බලතල, හොඳ පරීක්ෂාවකින් පසුව යළිත් පුනරීක්ෂණය කොට නීතිමය වශයෙන් හඳුනා ගනිමු. ගම්සභාවලට සම්බන්ධව කටයුතු

කරන ආණ්ඩුවේ ඒජන්තවරුන්ට සහ ඔවුනගේ නියෝජිතයන් (සාමදාන විනිශ්චයකරුවන්ට) සීමාසහිතව අප රට අධිකරණ කටයුතු භාර දෙමු. ඊට අමතරව ඔවුනට හරක් හොරුන්ට දඬුවම් පැමිණවීමේ අධිකරණ බලයද පැවැරීම තහවුරු කළ යුතුව ඇත...''

(Fifity years in Ceylon - Major Thomas skinner පරිවර්තනය - පරාක්‍රම ඇස්. විජේවර්ධන)

1856 දී පැනවූ, 1856 අංක 09 දරන කුඹුරු ඉඩම් සහ වාරිමාර්ග ආඥා පනත යටතේ නැවත වරක් මේ ගම් සභා පිහිට වූ අතර, පෙර පැවති නඩු හබ විසඳීම වැනි කාර්යයන්ගෙන් පූර්ණ වශයෙන් ඉවත්ව පැවති ගම් සභා මෙන් නොව මෙය නෛතික බලයක් සහිත පළාත් පාලන ඒකකයක් විය. රජයේ දිසාපති හෝ උප දිසාපති එහි මුලසුන දැරූ අතර අනෙකුත් සාමාජිකයන් පත් කරන ලද්දේ ඔහු විසිනි.

1861 පනවන ලද 1861 අංක 10 දරන මාර්ග කමිටු ආඥා පනත මඟින් පළාත්බද මාර්ග කමිටු සහ දිස්ත්‍රික් මාර්ග කමිටු පිහිටුවිණි. පොදු මාර්ග පද්ධතිය නඩත්තු කිරීම එමඟින් සිදු විය.

1848 දී ඇති වූ කැරැල්ලට හේතු වූ කරුණු සොයා බලා වාර්තා කිරීමට විශේෂ කමිටුවක් පත් කළ අතර, එහි නිර්දේශයන් පිළිබඳව අවධානය යොමු කළ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව කොළඹ නගරයට මහා නගර සභාවක් ලබා දෙන ලෙස යෝජනාවක් 1850 දී සම්මත කරන්නට යෙදුණි. ඒ සඳහා අණපනත් පිළියෙල කරන ලද්දේ ප්‍රසිද්ධ රාජ නීතිඥයකු වූ රිචඩ් මෝගන් විසිනි. කෙසේ වෙතත් කොළඹ නගරය තුළ නාගරික සභාවක් සංස්ථාපනය කිරීම සඳහා ව්‍යවස්ථාදායක මන්ත්‍රන සභාව වෙත පනතක් ඉදිරිපත් වන්නේ 1865 දී වන අතර, එය ඉදිරිපත් කරන ලද්දේ ආණ්ඩුකාරවර සර් හර්කියුලස් රොබින්සන් විසිනි.

1865 නොවැම්බර් මස 25 දින කොළඹ මහා නගර සභාවේ නගර සීමාවන් නියම කිරීමේ නිවේදනය නිකුත් කරනු ලැබීය. 1866 ජනවාරි 05 දින කොළඹ මහා නගර සභාව සඳහා ආණ්ඩුකාර වරයා විසින් පත් කරන ලද සභිකයන් ප්‍රකාශයට පත් කළ අතර

1866 ජනවාරි 12 දින සිට 15 දින දක්වා පැවති ඡන්ද විමසීමෙන් සභිකයින් 09 දෙනෙකු පත් කරගන්නා ලදී. ආණ්ඩුකාරවරයා විසින් සභිකයින් 05 දෙනෙකු පත් කරන්නට යෙදුණි. පත්කළ මන්ත්‍රී, රජයේ දිසාපති, සී. පී. ලෙයාඩ් මහතා සභාපතිවරයා ලෙස පත්කරන ලදී. තෝරා ගන්නා ලද සභිකයන්ද සමඟ පළමු නගර සභා රැස්වීම 1866 ජනවාරි 16 දා පැවැත්වුණි.

මහනුවර මහා නගර සභාව සහ ගාල්ල මහනගර සභාව 1866 වසරේදීම සංස්ථාපනය වූ අතර ඊට අදාළ ආඥා පනත්ද සම්මත කර ගැනුණි.

1871 දී ගෙන එන ලද 1871 අංක 26 දරණ ග්‍රාම ප්‍රජා පිළිබඳ ආඥා පනත සමඟ ගම්සභා නැවත ව්‍යවස්ථාගත කරන ලදී. මුල් කාලීනව ග්‍රාම කමිටු ලෙස හැඳින්වුනු මේවා පසුකාලීනව ගම් කාර්ය සභා ලෙස හඳුන්වන්නට යෙදුණි. අදාළ ප්‍රදේශයේ ගම්වාසීන්ගේ ඉල්ලීම මත ආණ්ඩුකාරවරයා සහ ව්‍යවස්ථාදායකය විසින් ග්‍රාම කමිටුවක් පත් කළ අතර, මුලසුන දරන ලද්දේ රජයේ ඒජන්තවරයා විසිනි. සුළු අපරාධ සහ සුළු ආරවුල් පිළිබඳව අධිකරණය බලයක්ද ග්‍රාම කමිටු සඳහා ලැබුණි. 1884 වර්ෂයේ දී ග්‍රාම කමිටු ආඥා පනතට ගෙන එන ලද සංශෝධනයක් අනුව ග්‍රාම කමිටුවේ සභාපතිවරයා ලෙස ගම්මුලාදෑනියා නිල බලයෙන් පත් විය.

1892 අංක 18 දරන සනීපාරක්ෂක මණ්ඩල ආඥා පනත අනුව කුඩා නාගරික ප්‍රදේශයන්හි පොදු සෞඛ්‍ය සේවා, ජලපවාහනය, මලපවාහනය, පොදු වෙළඳ සැල ආදී මහජන සේවාවන් ඉටු කිරීම උදෙසා සනීපාරක්ෂක මණ්ඩල පිහිටුවන ලදී.

1898 අංක 13 දරන ප්‍රාදේශීය මණ්ඩල ආඥා පනත අනුව විශාල නගර සඳහා ප්‍රාදේශීය සෞඛ්‍ය සහ සනීපාරක්ෂක මණ්ඩල සංස්ථාපනය කෙරුණි. මෙහි මීට පෙර සංස්ථාපනය කරන ලද කාර්යයයන්ද සනීපාරක්ෂක මණ්ඩලයන්හි කාර්යයන් හා සමාන විය. මලපවාහනය, ජලපවාහනය හා සෞඛ්‍ය සේවා සැපයීම ඉංග්‍රීසි බසින් sanitary board ලෙස හැඳින්වූ සනීපාරක්ෂක මණ්ඩලවල ප්‍රධානතම කාර්යයන් විය. වත්මනෙහි වුවද ජනවහරේ යෙදෙන

"සැන්ටිබෝඩ්" යන්න sanitary +board = santi + board යන්නෙන් බිඳී සකස් වූවක් විය.

1920 අංක 11 දරන පළාත් පාලන ආඥා පනත අනුව නාගරික දිස්ත්‍රික් සභා ප්‍රාදේශීය දිස්ත්‍රික් සභා සහ පොදු සභා පිහිටුවන්නට යෙදුණි. 1939 අංක 61 දරන නගර සභා ආඥා පනත යටතේ තරමක් විශාල නගර සඳහා නගර සභා පිහිටුවන ලදී. ඒ අනුව ස්ථාපිත කරන ලද නගර සභා සංඛ්‍යාව 27 ක් විය.

1945 අංක 03 දරන සුළු නගර සභා ආඥා පනත යටතේ කුඩා නගර සඳහා සුළු නගර සභා පිහිටු වූ අතර , සනීපාරක්ෂක සභා සහ ප්‍රාදේශීය සෞඛ්‍ය හා සනීපාරක්ෂක සභා අහෝසි කරන ලදී. ඒ අනුව පිහිටුවන ලද සුළු නගර සභා සංඛ්‍යාව 24 ක් වන අතර පොදු මාර්ග, මහජන සෞඛ්‍ය, පොදු පහසුකම් සැපයීම සහ ආදායම් එකතු කිරීම එහි කාර්යයන් අතර විය.

ඉහත සඳහන් සියලුම ආයතනයන්හි සේවක මණ්ඩලය බඳවා ගැනීම ඇතුළු පරිපාලනමය කටයුතු උදෙසා ආයතනගත ක්‍රමවේදයක් පැවති අතර සේවක වැටුප් ප්‍රමාණයන් එකී ආයතනයන් සතු මූල්‍යමය හැකියාව අනුව සකස් වී තිබුණි. ඇතැම් පළාත් පාලන ආයතන මගින් පශ්චාත් විශ්‍රාමික සුභ සාධක ක්‍රමයක් ලෙස විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක වූ අතර ඒ වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර ගැනීම උදෙසා අවැසි ප්‍රතිපාදන අදාළ ආඥාපනත්වලින්ම සළසා තිබුණි. ඒ අනුව එවක පැවති මහා නගර සභා සහ ඇතැම් ගම් සභා විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා සකස් කොටගෙන අමාත්‍යවරයාගේ අනුමැතිය යටතේ ආයතනයක විශ්‍රාම වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක කොට තිබුණි. 1946 අප්‍රේල් 01 දක්වාම මෙම ක්‍රමය ඒ ඒ පළාත් ආයතන තුළ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වෙමින් පැවතුණි. පළාත් පාලන ආයතන තුළ කාලානුරූපව පහත සඳහන් ප්‍රවර්ධනයන් සිදුවිය.

1856 ඉතා සීමිත කාර්ය භාරයක් සහිතව ස්ථාපනය කළ ගම් සභා ක්‍රමය.

1860 - 61 පළාත් මාර්ග කමිටු හා දිස්ත්‍රික් මාර්ග කමිටු ලෙස පළාත් පාලන ආයතන දෙවර්ගයක් පිහිට වූ අතර ඒවාට මාර්ග ඉදිකිරීම් හා නඩත්තුව පවරන ලදී.

1865 අංක 17 දරණ මහා නගර සභා පනත හඳුන්වා දෙමින් සර් හර්කියුලිස් රොබින්සන් ආණ්ඩුකාරවරයා විසින් කොළඹ මහා නගර සභාව ස්ථාපනය කිරීම.

1866 මහනුවර හා ගාල්ල මහා නගර සභා ඇති කිරීම.

1871 ගම් කාර්ය සභා පනත හඳුන්වා දීම හා ඒ අනුව දිවයින පුරා ග්‍රාමීය කමිටු පිහිටුවීම.

1892 සනීපාරක්ෂක මණ්ඩල පනත යටතේ සනීපාරක්ෂක මණ්ඩල (Sanitary Board) කුඩා නගර ආශ්‍රිතව පළාත් පාලන ආයතන ලෙසින් පිහිටුවීම.

1898 ප්‍රාදේශීය මණ්ඩල (Local Board) නමැති නව පළාත්පාලන අයාතන විශේෂයක් හඳුන්වා දීම.

1900 මුල් දශකය තුළ මෙරට වතු ආර්ථිකයෙහි ප්‍රමුඛ මධ්‍යස්ථානයක් වූ නුවරඑළිය නගරය සඳහා නුවරඑළිය සංවර්ධන මණ්ඩලය නම් වූනව පළාත් පාලන ආයතනයෙන් හඳුන්වා දීම.

1920 අංක 11 දරණ පළාත් පාලන ආඥා පනත අනුව නව පළාත් පාලන ආයතන වර්ග 3ක් හඳුන්වාදීම.

- මහා නගර සභාවලින් බාහිර ප්‍රදේශ නාගරික සඳහා නාගරික දිස්ත්‍රික් සභා.
- පොදු දිස්ත්‍රික් සභා.
- ඌන සංවර්ධිත ප්‍රදේශ සඳහා ග්‍රාමීය දිස්ත්‍රික් සභා.

මෙම ආයතන ඇති කරනු ලැබුවේ 1916 වර්ෂයේදී එවකට පැවති පළාත් පාලන ක්‍රමයට සංශෝධන ගෙන ඒම සඳහා ප්‍රේසර් කොමිෂන් සභාව සිදු කළ නිර්දේශ සැලකිල්ලට ගනිමිනි. කෙසේ

වෙතත් විවිධ අඩුපාඩු හා මහජන විරෝධතා හේතුවෙන් මෙම පළාත් පාලන ආයතන ප්‍රචලිත නොවීය.

1931 ඩොනමෝර් කොමිෂන් සභා වාර්තාව අනුව නව ආණ්ඩුක්‍රමය යටතේ ඇති කරන රාජ්‍ය මන්ත්‍රණ සභාව විධායක කාරක සභා ක්‍රමයක් සහිත වූ අතර එකී කාරක සභා අතර පළාත් පරිපාලනය භාරව කටයුතු කිරීමටත් පළාත් පරිපාලන ප්‍රතිපත්ති තීරණය කිරීම සඳහාත් එක් විධායක කාරක සභාවක් ඇති කිරීමට (Excutive Committe on Local Administaration) නිර්දේශ කරන ලදී.

දෙවනුව එතෙක් පළාත් පාලන භාරව කටයුතු කළ පළාත් පාලන මණ්ඩලය (Local Government Board) අහෝසි කොට ඒ වෙනුවට දිවයිනේ පළාත් පාලනය භාරව කටයුතු කිරීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව නම් වූ විශේෂ ආයතනයක් පුර්වෝක්ත විධායක කාරක සභාවේ පාලනයට යටත්ව පිහිටුවීම.

**ඩොනමෝර් ප්‍රතිසංස්කරණ සිදු කළ නිර්දේශ**

1. පළාත් පරිපාලනය පිළිබඳ රාජ්‍ය මණ්ත්‍රණ සභාවේ විධායක කරක සභාව ස්ථාපනය කිරීම.

2. සමස්ථ දේශය ආවරණය වන පරිදි පළාත් පාලන ආයතන ව්‍යුහය පාලනය කිරීම. ඊට මගපෙන්වීම හා එය වෙත ඉදිරි දර්ශනය සැපයීම පිණිස පළාත් පාලන කොමසාරිස්වරයාගේ ප්‍රධානත්වයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව සංවිධානය කිරීම.

3. එම දෙපාර්තමේන්තුව පළාත් පාලන ක්ෂේත්‍රයේ විෂය පථය හා බලතල තවදුරටත් පුළුල් කිරීම සඳහාත් පළාත් පාලන ආයතන වෙත පරිපාලනමය හා තාක්ෂණික විශේෂඥතාව ලබාදීමේ සංචිතයක් ලෙසත් ගොඩනැංවීම.

4. ආණ්ඩුකාරවරයා විසින් නම් කළ පළාත් පාලන ආයතනයන්හි සාමාජිකයන් වෙනුවට අභිනවයෙන් හඳුන්වාදුන් සර්වජන

ඡන්ද ක්‍රමය මත මහජන ඡන්දයෙන් තේරී පත්වන නියෝජිතයින් පළාත් පාලන ආයතන වෙත තෝරා පත්කර ගැනීම.

5. පළාත් පාලන ආයතන පද්ධතිය ප්‍රතිසංවිධානය කිරීම සහ නව ආයතන ඇති කිරීම.

6. පළාත් පාලන ආයතනවලට තරග කරන අපේක්ෂකයින්ගේ සුදුසුකම් රාජ්‍ය මන්ත්‍රණ සභාවේ නියෝජිතයන්ගේ සුදුසුකම් හා සම කිරීම.

**පළාත් පාලන සේවයෙහි ආරම්භය**

1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥා පනත සම්මත වීමෙන් පසුව 1946 අප්‍රේල් මස 01 දින සිට පළාත් පාලන සේවය ආරම්භ විය. සෑම පළාත් පාලන ආයතනයකම කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා අනුෂංගික කටයුතු කිසියම් පොදු නෛතික රාමුවක් යටතට ගෙන ඒම මෙමගින් සිදුවිය. මෙම ආඥා පනත තුළින් පළාත් පාලන සේවා කොමිෂන් සභාව ස්ථාපිත වූ අතර එතැන් සිට පළාත් පාලන සේවයේ කාර්ය මණ්ඩල පත් කිරීම, මාරු කිරීම, උසස් කිරීම, විශ්‍රාම ගැන්වීම සහ ඔවුන්ගේ විනය පාලනය එකී කොමිෂන් මගින් සිදුවිය. අදාළ ආඥා පනතේ පළමුවන උපලේඛනයෙහි සඳහන් කර ඇති තනතුරුවල නිරත මහා නගර සභා, නගර සභා සහ ගම්සභාවල නිලධාරින්ගෙන් සහ සේවකයන්ගෙන් පළාත් පාලන සේවය සංස්ථාපනය වූ අතර ඔවුන් වෙනුවෙන් පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දුණි. මෙම උපලේඛනයේ සඳහන් නොවුණු සේවකයන් තවදුරටත් ආයතනගත සේවකයන් ලෙස සලකනු ලැබිණි. පළාත් පාලන සේවා ආඥා පනතෙහි 29 වන වගන්තිය අනුව පළාත් පාලන සේවා අර්ථ සාධක අරමුදලක් පිහිටුවීමටත් 26 වගන්තිය අනුව ''විශ්‍රාම වැටුප් ක්‍රමය '' යනුවෙන් යෝජනා ක්‍රමයක් සහ සේවයේ සාමාජිකයන්ගේ වැන්දඹුවන්ට සහ අනත්දරුවන්ට විශ්‍රාම වැටුප් ලබාගැනීම සඳහා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලක් හෝ ක්‍රමයක් පිහිටුවීමටත් විධිවිධාන සළසා තිබුණි. එකී

විධිවිධාන අනුව එම අරමුදල් පිහිටුවීම පිළිබඳ ගැසට් නිවේදනය 1952 ජුලි මස 30 අංක 10,429 දරන රජයේ විශේෂ ගැසට් පත්‍රයේ පළ විණ.

කෙසේ වෙතත් පළාත් පාලන සේවා ව සංස්ථාපනය කිරීම පිළිබඳව මහා නගර සභාවන් තුළ වූයේ දැඩි අකමැත්තකි. සභාව විසින් සිය සේවකයන් පත් කිරීමට තිබූ අයිතිවාසිකම් අහෝසි කරමින්, පළාත් පාලන සේවය පිහිටුවීම ප්‍රතිගාමී ක්‍රියාවක් ලෙස සභාව සලකන ලදී. ඒ පිළිබඳව සිය විරෝධය දැක්වීම පිණිස වූ යෝජනාවක් 1947 අප්‍රේල් 12 සහ 13 දිනයන්හිදී කරච්චියේ පැවති ඉන්දියාවේ, පාකිස්තානයේ. බුරුමයේ හා ලංකාවේ නගරාධිපතිවරුන් සහ උප නගරාධිපතිවරුන්ගේ සම්මේලනයේදී සම්මත කර ගැනුණි.

"ලංකාවේ පළාත් පාලන ආයතන විසින් සේවයේ යොදවා ඇති පළාත් පලාන ආයතනයේ අරමුදලින් වැටුප් ලබන සියලු සේවකයින් පළාත් පාලන සේවා කොමිෂන් සභාව යටතට ගෙන, ඔවුන් එම කොමිසමේ සේවකයින් කරමින් 1945 අංක 43 දරන ලංකාවේ පළාත් පාලන සේවා ආඥා පනතේ සඳහන් විධිවිධානයන් කෙරෙහි ඉන්දියාවේ, පාකිස්තානයේ, බුරුමයේ සහ ලංකාවේ නගරාධිපතිවරුන් සහ උප නගරාධිපතිවරුනරගෙන් සමන්විත මෙම සම්මේලනය විරෝධය පළ කරන්නීය. මෙම ක්‍රියාව වූ කලී, ආපස්සට තැබූ පියවරක් වන අතර, ප්‍රජාතන්ත්‍රවාදයේ වැඩීමට අවහිරයක් ද වන හෙයින් ස්වතන්ත්‍ර පාලනය අහෝසි කිරීමක් වන්නේය. තවද, එම ආඥා පනතේ විධිවිධානවලින්, කොළඹ, මහනුවර හා ගාල්ල යන නාගරික සභා නිදහස් කරන මෙන්ද මෙම සමමේලනය ඉල්ලා සිටින්නීය."

කෙසේ වෙතත් මෙම යෝජනාව පිළිබඳව රජය සැලකිල්ලක් දැක්වූයේ නැත. විටෝල් බවුස්ටඩ් සහෝදර සමාගම මගින් පවත්වාගෙන ගිය ට්‍රෑම් රථ සේවාව 1944 සැප්තැම්බර් 01 දින කොළඹ මහ නගර සභාව විසින් පවරා ගනු ලැබීය. නගරයේ මාර්ග යන්ගේ වූ තදබදය වැළැක්වීම පිණිස ට්‍රොලි බස් රථ සේවාවක්

ආරම්භ කිරීමට ද මහ නගර සභාව තීරණය කළේය. පළාත් පාලන ක්‍රමය තුළ පහත සඳහන් වැදගත් අවස්ථා නිරූපනය විය.

## 1. 1969 අංක 18 දරන පළාත් පාලන සේවා පනත

පළාත් පාලන සේවා ආඥා පනත පරිච්ඡින්න කරමින් 1969 අංක 18 දරන පළාත් පාලන සේවා පනත සම්මත විය. මෙහි දී පළාත් පාලන සේවා ආඥා පනත පරිච්ඡින්න කරනු ලැබූවද 1945 අංක 43 දරන පළාත් පාලන පනතේ 29, 31 සිට 44, 47 සිට 52, 54 සහ 59 සිට 62 දක්වා වගන්ති තවදුරටත් බලාත්මක වන පරිදි විධිවිධාන සළසා තිබුණි. මේ හේතුව නිසා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායකත්වය පිළිබඳ තීරණය පෙර පරිදිම ගනු ලැබීය යුතු විය. 1969. 10. 01 දින සිට රාජ්‍ය සේවයට සමාන්තරව පළාත් පාලන සේවයේ ද වැටුප් ප්‍රතිශෝධනය ක්‍රියාත්මක වුණු අතර ඒ අනුව ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක විය. 1969 ඔක්තෝබර් මස 01 දා සිට ආයතනගත සේවකයන්ගේ වැටුප් ද ඒ අනුව වැඩි විය. 1969 අංක 18 දරන පළාත් පාලන සේවා පනතේ උපලේඛනය අනුව, මෙම වැටුප් ප්‍රතිශෝධන සමඟ පළාත් පාලන සේවයට අයත් නොවූ ආයතන සේවකයන් විශාල ප්‍රමාණයකට පළාත් පාලන සේවයට අන්තර්ග්‍රහනය වීමේ අවස්ථාව උදා විය. එහෙත් ඔවුන්ට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ සාමාජිකත්වය ලබාදීම කළ නොහැකි විය. 1945 පළාත් පාලන සේවා ආඥා පනතෙහි අදාළ වගන්ති තවදුරටත් ක්‍රියාත්මක වීම ඊට හේතු විය.

## 2. ට්‍රොලි බස් රථ සේවාව පවරාගැනීම

විටෝල් බවුන්ස්ටඩ් සහෝදර සමාගම මගින් පවත්වාගෙන ගිය ට්‍රෑම් රථ සේවාව 1944 සැප්තැම්බර් 01 දින කොළඹ මහ නගර සභාව විසින් පවරා ගනු ලැබීය. නගරයේ මාර්ගයන්ගේ වූ තදබදය වැළැක්වීම පිණිස ට්‍රොලි බස් රථ සේවාවක් ආරම්භ කිරීමට මහ නගර සභාව ඒ අතර තීරණය කළේය. කොළඹ නගරය තුළ ක්‍රියාත්මක වූ ට්‍රොලි බස් රථ සේවාව පවත්වාගෙන යන ලද්දේ විටෝල් බවුස්ටඩ් සහෝදර සමාගම විසිනි. ඒ අනුව එය 1953. 07. 22 දින කොළඹ මහා නගර සභාව විසින් පවරා ගන්නා ලදී. එය

පාඩු ලබන කර්මාන්තයක් වූ නිසා පසු කාලීනව 1965. 01. 01 දින වසා දමුණු අතර ඊට අදාළ සේවකයන් 1965. 04. 01 දින තනතුර අහෝසි වීම මත විශ්‍රාම ගැන්වුණි. මොවුන් අතුරින් විටෝල් බවුස්ටඩ් සහෝදර සමාගමේ සිට කොළඹ මහා නගර සභාවේ සේවයට පළාත් පාලන සේවයේ තනතුරුලාභීන් ලෙස ඇතුළත් කරගන්වන ලද තැනැත්තන්ට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ දායකත්වය පිරිනැමීම ආඥා පනතේ පැවති නියමයන් නිසා කළ නොහැකි විය. එහෙත් ට්‍රොලි බස් රථ සේවාව සඳහා පළාත් පාලන කොමිෂන් සභාව මඟින් බඳවා ගනු ලැබූ තැන්තතන්ට මේ හිමිකම ලබාගැනීමට අවස්ථාව සැළසිණ.

### 3. 1974 අංක 16 දරන පළාත්පාලන සේවා පනත

පළාත් පාලන සේවයක් සංස්ථාපනය කිරීම සහ විධිමත් කිරීම සඳහා විධිවිධාන සැළැස්වීමත්, පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයක් සහ විනය මණ්ඩලයක් පිහිටුවීම සහ 1969 අංක 18 දරන පළාත් පාලන සේවා පනත ඉවත් කිරීම ඇතුළු අරමුණු කිහිපයක් මුල් කොටගෙන 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත, ජාතික රාජ්‍ය සභාව විසින් සම්මත කරන ලදී. මෙමගින් පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුවක් සහ පළාත් පාලන සේවා අධ්‍යක්ෂ ධුරයක් ඇති කිරීමට ප්‍රතිපාදන සැලසුණි. මෙම පනතේ 15 වගන්තිය යටතේ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් හිමි සාමාජිකයන් සඳහා විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික දීමනා ගෙවීම සඳහා පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල ද, 16 වගන්තිය යටතේ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත සාමාජිකයන්ගේ වැන්දඹුවන්ට සහ අනත්දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා පළාත් පාලන සේවා වැන්දඹු සහ අනත්දරු අරමුදල ද, 17 වගන්තිය යටතේ පළාත්පාලන සේවයේ විශ්‍රාම වැටුප් රහිත සාමාජිකයන්ට ප්‍රතිලාභ සැළැස්වීම සඳහා පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදල ද පිහිටුවා ඇත. එකී අරමුල් පාලනය කිරීමේ බලය පළාත් පාලන සේවා අධ්‍යක්ෂ වෙත හෝ ඒ සඳහා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන නිලධාරියෙකු වෙත පැවරුණි.

## 4. 1985 අංක 10 දරන පළාත්පාලන සේවා (සංශෝධන) පනත

1985 අංක 10 දරන පළාත් පාලන සේවා (සංශෝධන) පනත මගින් පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය වෙනුවට පළාත් පාලන සේවා කොමිෂන් සභාවක් පිහිටුවීම ඇතුළු සංශෝධනයන් කිහිපයක් සිදු කරන ලදී. ප්‍රධාන ප්‍රඥප්තියේ (1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත) '16 අ' නමින් නව වගන්තියක් ඇති කළ අතර, එමගින් පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත සාමාජිකයන්ගේ වැන්දඹු පුරුෂයන්ට සහ අනත්දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල නමින් අරමුදලක් පිහිටුවීමට නීතියෙන් ඉඩකඩ සළස්වා දෙනු ලැබිණ.

## 5. 1975 පළාත් පලාන සේවා විශ්‍රාම වැටුප් නියෝග

පළාත් පාලන සේවයේ සාමාජිකයන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක වීම ආරම්භ වූයේ 1952 අගෝස්තු 01 දා සිටය. මෙම නියෝග අංක 10, 429 දරන 1952. 07. 30 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කර ඇත. 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 23 සහ 24 වගන්තිය යටතේ පළාත්පාලන අමාත්‍යවරයා විසින් මෙමම නියෝග පරිච්ඡින්න කරමින් 1975 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් නියෝග ප්‍රකාශයට පත් කර ඇත. මෙම නියෝග 1976 ජනවාරි මස 09 වන දින අංක 1976 ජනවාරි මස 09 වන දින අංක 198 දරන ගැසට් පත්‍රයේ පළ කර ඇති අතර, එකී නියෝගයන් වෙත කරන ලද සංශෝධනයන් 1978 ජුනි 07 දින අංක 320/8 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කෙරුණි.

## 6. 1985 පළාත්පාලන සේවා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් නියෝග

1945 පළාත්පාලන සේවා ආඥා පනත යටතේ සාදන ලද 1952 වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල පිළිබඳ ව්‍යවස්ථාවන් වෙනුවට ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන

සේවා පනතේ 23 වගන්තිය යටතේ එවකට සිටි පළාත් පාලන, නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගයක් 1985 පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් නියෝග යනුවෙන් හැඳින්වුණි.

1986 ජුනි 03 අංක 404/11 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් මෙම නියෝග ප්‍රකාශයට පත් වූ අතර අදාළ අරමුල් පාලනය කිරීමේ බලතල පළාත් පාලන සේවා අධ්‍යක්ෂවරයා වෙත පැවරිණි. පළාත් පාලන සේවයේ සේවා කොන්දේසි සහ සම කිරීමට 1978. 03. 25 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයට අනුව සිවිල් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ දායකයින්ගේ ආබාධිත දරුවන් සඳහා ලබා දෙනු ලැබූ විශේෂ සහනය පළාත් පාලන සේවයේ සාමාජිකයන්ගේ ආබාධිත දරුවන් වෙත ද ලබාදීමට හැකි වන පරිදි අදාළ නීතිමය ප්‍රතිපාදන මෙහිදී ලබා දුණි.

### 7. 1986 පළාත් පාලන වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදල් නියෝග

පළාත් පාලන සේවා කොන්දේසි රාජ්‍යසේවා කොන්දේසි හා සම කිරීමට ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණයට අනුව යමින් 1974 අංක 16 දරන පළාත් පාලන සේවයේ සාමාජිකාවන් සඳහා ද වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඇති කිරීමට නීතිමය ප්‍රතිපාදන ඇති කෙරුණි. මේ යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග 1987 ජනාවරි 28 දින අංක 438/08 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කෙරුණි.

### 8. පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල

පළාත් පාලන ආයතනයන්හි සේවය කොට විශ්‍රාම ලැබූ විශ්‍රාම වැටුප් හිමිකම් සහිත නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම සිදු කරන ලද්දේ මෙම අරමුදල මගිනි. අරමුදල සඳහා රජය විසින් දායකත්වය සැපයීමක් එකල සිදු නොවුණි. පාරිතෝෂික හා විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා දායකත්වය පළාත් පාලන ආයතන වෙතින් සැපයුනු අතර එක් එක් පළාත් පාලන ආයතන විසින් ඒ ඒ

සේවකයන්ට ගෙවන ලද පඩිනඩිවල අනුපාතය අනුව අදාළ පළාත් පාලන ආයතන විසින් ගෙවිය යුතු අරමුදල් ප්‍රමාණය තීරණය වුණි. සමහර පළාත් පාලන ආයතන විසින් නියමිත දිනට විධිමත් පරිදි දායක මුදල් ගෙවීම සිදු කළත් සමහර පළාත් පාලන අයාතන විසින් නිසි පරිදි ගෙවීම් නොකරන ලදී. නිසි පරිදි ගෙවීම් කරනු නොලැබූ එවැනි ආයතනයන්හි සේවය කොට විශ්‍රාම ලැබූ සේවකයන්. විශ්‍රාම වැටුප් ගෙවන දිනය එළඹියත් කිසිත් නොලබා බිඳුනු සිතින් පිටව යනු දකින්නට ලැබුණි. මෙම වේදනාබර තත්ත්වය අවසන් කිරීම සඳහා රජයේ ඒකාබද්ධ අරමුදලින් පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා අත්තිකාරම් ලබාගැනීමට පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් පියවර ගන්නා ලදී. එතැන් සිට සෑම විශ්‍රාමිකයෙකුටම නියමිත දිනයේදී තමාට හිමි විශ්‍රාම වැටුප ලබාගැනීමට ඉඩ ප්‍රස්ථාව සැලසුණි. 1982. 01.02 හෝ එදිනට පසුව විශ්‍රාම ගනු ලබන පළාත් පාලන විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් සහ ඒ සමඟ ගෙවිය යුතු වෙනත් දීමනා පළාත් පාලන ආයතනවලට සහ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන සේ බෙදා වෙන් කර තිබුණි. ඒ පහත පරිදිය.

| නිලධාරියා සේවය කළ පළාත් පාලන ආයතන වර්ගය | පළාත් පාලන ආයතනය විසින් ගෙවිය යුතු දායක මුදල් ප්‍රතිශතය | රජය මගින් ගෙවිය යුතු මුදල් ප්‍රතිශතය |
|---|---|---|
| මහ නගර සභාවල පමණක් | 85% | 15% |
| මහ නගරසභා එකක හෝ ඊට වැඩි ගණනක් සමඟ අනෙකුත් වර්ගයේ (නගර සභා. සුළු නගර සභා, ගම් සභා සහ ප්‍රාදේශීය සභා) පළාත් පාලන ආයතනවල සේවය කළ | 70% | 30% |
| මහ නගර සභා හැර වෙනත් පළාත් පාලන ආයතනවල (නගර සභා, සුළු නගර සභා, ගම් සභා සහ ප්‍රාදේශිය සභා සේවය කළ) | 55% | 45% |

## 9. පළාත් පාලන සේවා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල

පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් හිමිකම් සහිත සේවකයන්ගේ වැන්දඹුවන්ට සහ අනත්දරුවන්ට ප්‍රතිලාභ ගෙවීම සඳහා මෙම අරමුදල පිහිටුවා ඇත. අදාළ සේවකයන්ගේ සහ අදාළ ආයතනයේ දායකත්වයෙන් මෙම අරමුදල ගොඩනැගී ඇති අතර දායක මුදලින් 3/4 ප්‍රමාණයක් සභා දායකය ලෙස අය කරනු ලැබේ.

## 10. පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල

පළාත් පාලන සේවා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම සහිත සේවිකාවන්ගේ වැන්දඹු පුරුෂයන්ට හා අනත්දරුවන්ට ප්‍රතිලාභ ගෙවීම සඳහා මෙම අරමුදල පිහිටුවා ඇත.

## 11. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

1987 වර්ෂයේදී සිදු කරන ලද 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව පළාත් සභා සංස්ථාපනය කරන ලදී. පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය තුළට අයත්ව තිබූ කාර්ය මණ්ඩල කළමනාකරණ කටයුතු 1989.12.31 දිනෙන් පසුව එක් එක් පළාත් පාලන කොමිෂන් සභාව වෙත පවරනු ලැබුණි. ඉතිරිව තිබූ විශ්‍රාම වැටුප් සහ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් කාර්යය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත පවරනු ලැබුණි.

විශ්‍රාම වැටුප් දොපර්තමේන්තුවට පැවරුණු මෙම නව කාර්යභාරය ඉටු කිරීම සඳහා පළාත් පාලන විශ්‍රාම වැටුප් ඒකකය යනුවෙන් වෙනම ඒකකයක් 1990.01.01 වන දින විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි ස්ථාපිත කෙරුණි.

එක් එක් පළාත් සභාව විසින් සම්මත කරගන්නට යෙදුණු පළාත් පාලන ආයතන (කාර්යාල මණ්ඩල) ප්‍රඥප්තිය අනුව ඒ ඒ පළාත් සභා බල ප්‍රදේශයට අයත්ව තිබූ පළාත් පාලන ආයතනවල සේවය කරන ලද පළාත් පාලන සේවයේ සාමාජිකයන්, අදාළ පළාත් සභාව තුළ ක්‍රියාත්මක වන පළාත් රාජ්‍ය සේවාවට අන්තර්ග්‍රහණය කර ගැනීම සඳහා අවශ්‍ය නෛතික විධිවිධාන

ඇතිකර ගැනුණි. මෙම නෛතික විධිවිධානයන්ට අනුව පළාත් පාලන සේවකයන් පළාත් රජය සේවාවට අන්තර්ග්‍රහණය කළ යුතු වූයේ එතෙක් ඔවුන් පළාත් පාලන සේවයේ අත්කර ගෙන තිබූ අයිතිවාසිකම් සහ වරප්‍රසාදවලට අගතියක් නොවන පරිදිය.

කෙසේ වෙතත් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය අදාළ වන්නේ රාජ්‍ය සේවයේ සාමාජිකයින් සඳහා පමණක් වන බැවින් පළාත් රාජ්‍ය සේවාවේ සාමාජිකයන් සඳහා එය අදාළ කරගත නොහැකි තත්වයක් ඇති විය. එය මගහරවාලීම පිණිස පළාත් රාජ්‍ය සේවාවේ සාමාජිකයන්ට ද පළාත් රාජ්‍ය සේවාව සඳහා අන්තර්ග්‍රහණය කර ගනු ලැබූවන්ට ද විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය, 1898 වැන්දඹු අනත්දරු ආඥා පනත සහ 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් පනත අදාළ කරවීම පිණිස 1993 අංක 17 දරන පළාත් සභා විශ්‍රාම වැටුප් පනත පාර්ලිමේන්තුවේ සම්මත කරගන්නට යෙදුණි. මෙම පනතේ නියමයන් 1993.09.03 දින සිට ක්‍රියාත්මක විණි. මේ අනුව පළාත් පාලන විශ්‍රාම වැටුප් ක්‍රියාත්මක වන්නේ 1993.09.03 දිනට පෙර පළාත් පාලන ආයතනයන්හි සේවය කොට විශ්‍රාම ලැබූ තැනැත්තන් සඳහාත්, ඔවුන්ගේ කලත්‍රයන්, අනත්දරුවන් සහ ආබාධිත දරුවන් සඳහා ප්‍රතිලාභ ගෙවීමය.

## 12. පළාත් පාලන විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි වර්තමාන තත්වය

1987 වර්ෂයේ සිදු කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය, 1993 පළාත් සභා විශ්‍රාම වැටුප් පනත හා 1993.9.3 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව පළාත් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා නිලධාරීන්ට සිවිල් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අදාළ කරවීමට විධි විධාන සලස්වන ලදී. එබැවින් සිවිල් රාජ්‍ය නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ මෙම පළාත් රාජ්‍ය නිලධාරීන්ට ද හිමි වේ. එබැවින් පළාත් පාලන විශ්‍රාම වැටුප් ක්‍රමය අහෝසි කරමින් එය සිවිල් විශ්‍රාම වැටුපට ඒකාබද්ධ කරනු ලැබ ඇත. මීට අවශ්‍ය සංශෝධන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේම සිදු කොට තිබේ.

# කැස්බෑව නගර සභාව ස්ථාපනය 3

පැරණි සිංහල පරිපාලන බෙදීමට අනුව රයිගම් හා සල්පිටි කෝරළ ඒකාබද්ධව පානවුණ කෝරළේ ලෙසද, 15 වන සියවසෙන් පසුව සල්පිටි කෝරළය ලෙස, සල්පිටි කෝරළයට පල්ලේපත්තුව හා උඩගහපත්තුව යන උප කොටස් දෙකක්ද සම්බන්ධව පැවතුණි. 16 වන සියවසෙන් පසුව ලන්දේසි තෝම්බුවල සල්පිටි කෝරළේ උඩගහපත්තුවට ගම් 21 ක් ද පල්ලේපත්තුව එනම් කැස්බෑව කොට්ඨාශයට ගම් 79ක් ද ජනාවාසව පැවති බවට ලේඛනගතව ඇත. බ්‍රිතාන්‍ය මුඩලියර් යුගයෙන් පසු 20 වන සියවසේදී 'සල්පිටි කෝරළේ' පල්ලේපත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය ලෙස ද, වත්මන් කැස්බෑව, මොරටුව හා හෝමාගමට අයත් වැතර, පොල්ගස්ඕවිට, උන්දුරුගොඩ, රිලාවල, සිද්ධමුල්ල ආදී ගම් ඒකාබද්ධව ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශය (ඩී. ආර්. ඕ. කොට්ඨාශය) ස්ථාපිතව පැවතිණි. 1973 දී මොරටුව, කැස්බෑව, හෝමාගම වෙන් වී උප දිසාපති කොට්ඨාශ තත්ත්වයට පත් විය. පරිපාලන වශයෙන් බෙදීම් එසේ පවතිද්දී කැස්බෑව කොට්ඨාශයට අදාළ වූ පළාත් පාලන ව්‍යුහයද කාලීන අනන්‍යතාවයන්ට අනුව පහත සඳහන් පරිදි විකාශනය වෙමින් පැවතුණි.

**1. මාම්පේ කැස්බෑව ගම් කාර්ය සභාව**

ශ්‍රී ලංකාව තුළ නගර සභා ක්‍රමය 1939 වර්ෂයේදී ඇරඹුණත් 1882 අක 18 දරන සුළු නගර පනත යටතේ දිවයිනේ ඇතැම් නගර සුළු නගර වශයෙන් සංස්ථාපනය විය. පිළියන්දල නගරය

ද 1912 දී එසේ සුළු නරගයක් ලෙස පිහිටුවා ඇත. අවිස්සාවේල්ල, පුවක්පිටිය, පාදුක්ක, පූගොඩ, වේයන්ගොඩ, ජාඇල, පැලියගොඩ, කොච්චිකඩේ හා ගම්පහ එම වසරේදී මෙසේ සුළු නගර බවට පත්කළ කොළඹ දිස්ත්‍රික්කයේ නගර විය.

බස්නාහිර පළාත ආණ්ඩුවේ ඒජන්තවරයා වූ ජේ. පී. ප්‍රේෂර් පිළියන්දල ප්‍රදේශයේ මාර්ග, කොන්ක්‍රීට් කානු, වෙළෙඳපොළ, සනීපාරක්ෂක සේවා, ජලනල, පාසල් ආදිය සැලසුම් සහතව නිර්මාණය කර 'පිළියන්දල' නගරයක් බවට පත් කළ නිසා පිළියන්දල 'ප්‍රේෂර් ටවුන්' යනුවෙන් හඳුන්වනු ලැබීය. ඔහු මෙම නගර සංවර්ධනයට විශේෂ සැලකිල්ලක් දක්වූ බවද පෙනේ. බස්නාහිර පළාත ආණ්ඩුවේ ඒජන්තවරුන්ගේ දිනපොත් හා ශ්‍රී ලංකා පරිපාලන වාර්තාවල සඳහන් පහත තොරතුරු ඊට සාක්ෂි වනු ඇත.

| දිනය | වාර්තාව |
|---|---|
| 1912.08.06 | පිළියන්දලට පැමිණ පොදු වෙළෙඳපොළ සඳහා බිම් කොටසක් පරීක්ෂා කළා. කුඩා මාර්ග දෙපස කානු සඳහා අවශ්‍ය ගල් කැබලි ආනයනය කරමින් පවතී. |
| 1912.09.07 | පිළියන්දල කොන්ක්‍රීට් කානු තනමින් තිබූ අතර ඒ නිසා ප්‍රදේශයේ පෙනුම හඳුනාගත නොහැකි වන පරිදි වෙනස් වෙමින් පවතී. |
| 1912.09.14 | පිළියන්දල කානු පරික්ෂා කරන ලදී. |
| 1912.09.15 | පෙරදින පුවත් වාර්තාවෙන් කානුවලට හානි සිදුවී ඇත. අලුත් වෙළෙඳපොළ පරීක්ෂා කළ අතර ඉදිකිරීමට බලාපොරොත්තු වන ගොඩනැගිලි කෙසේ විය යුතුද යන්න අධ්‍යයනය කරන ලදී. |
| 1912.10.03 | පිළියන්දල දැනට ඉදිවෙමින් පවතින අලුත් කානු පරීක්ෂා කර ඇත. වෙළෙඳපොළ ඉදිකරන භූමිභාග යේ මිනුම් කටයුතු කර ඇත. ලබන සතියේ |

වෙළෙඳපොළ සැලැස්ම සකස් කළ හැකිවේ. පිළියන්දල වෙළෙඳපොළ මගින් සැලකිය යුතු බදු ආදායමක් උපයාගත හැකිවේ.

පිළියන්දල තවමත් පොදු වැසිකලියක් ඇති නගරයක් වේ. එම වැසිකිලිය වෙළෙඳපොළට කිට්ටුය. එය පිරිසිදුව පාලනය කරනු ලැබේ. සනීපාරක්ෂාව යහපත් වේ.

1916.09.16 රජයේ වැඩ දෙපාර්තමේන්තුව අලුත් කානු සැකසීම ආරම්භ කර ඇත.

1916.10.03 ප්‍රධාන මාර්ගයේ කානු පද්ධතිවල වැඩ සිදු කෙරෙමින් පවතී.

1916.11.08 සුළු කොටසක් ගල් අතුරා ඇති අලුත් කානු පරීක්ෂා කෙළෙමි. කටයුතු සාර්තකයි. දිවා ආහාරය කැස්බෑව තානායමින් ලබාගත්තා.

1917 කැස්බෑව දක්වා පාර පළල් කිරීමට හා වෙළෙඳපොළ කොටස සංවර්ධනය කිරීමට ඉඩම් හා දේපොළ පවරාගෙන ඇත. නගරයට සුළු ජල සැපයුමක් ලබාදී තිබේ. ඉහළින් පිහිටි එම ටැංකියට ජලය අතින් පොම්ප කරනු ලැබේ. ජලය ප්‍රධාන දිය නළ දෙකකට බෙදී ඇති අතර, යළිත් දියනළ හතරක් මගින් නගරයට ජලය බෙදාහැරේ. ජල බදු අය නොකෙරේ. මෙම ජල ව්‍යාපෘතිය ඉතා ජනප්‍රිය වී ඇත.

1918 ජල සම්පාදනය අඛණ්ඩව ක්‍රියාත්මක වේ. කොළඹ මාර්ගය පුළුල්කිරීම සඳහා ඉඩම් පවරාගෙන ඇත. වෙළෙඳපොළ භූමියේ පාරවල් සකස්කොට භූමිය සමතලා කර ඇත. එහි කදිම පෙනුමක් ඇත. නව වෙළෙඳපොළෙහි ගොඩනැගිලිවලින් කොටසක්

ඉදිකර ඇත. මල හා කුණු කසල ඉවත් කිරීම කාර්යක්ෂමව සිදු කෙරේ.

1919 මොරටුව පාරේ සිට මහජන උද්‍යාන බිම දක්වා කොටසක් විවෘත කර ඇත. කොළඹ සෙනිටරි බෝඩ් මගින් වෙළෙඳපොළ සඳහා අලුත් කඩ සාප්පු දෙකක් තනාදී ඇත. ජල සැපයුම සතුටුදායක ලෙස පවත්වාගෙන යනු ලැබේ.

1920 මල හා කුණු කසල ඉවත්කිරීම පෙර පරිදි සිදුවේ. හොඳ තත්ත්වයේ කඩ සාප්පු ඉදිකර ඇත. පාරවල් විවෘත කිරීම් හා කානු ද්‍රව්‍ය සඳහා රජය රු. 15000ක මුදලක් සපයා ඇත. ද්විභාෂා පාසලක් ඉදිකිරීම ගැන දිස්ත්‍රික් පාසල් කමිටුවේ උනන්දුව හා ක්‍රියාකාරිත්වය පවතී. එයින් නගරයේ දැකුම්කළු බව ඉතා ඉහළ මට්ටමක් ගෙන ඇත. මහජන උයනේ සැලැස්ම හොඳ ප්‍රගතියක් අත්කරගෙන තිබේ. 1920 ඔක්තෝබර් මස 29 වන දින සර් විලියම් හෙන්රි මැනින් ආණ්ඩුකාරතුමා කැස්බෑවට පැමිණි බවද කදිම අලුත් ද්විභාෂා පාසලක් පිළියන්දලදී විවෘත කළ බවද සඳහන් වේ. එය ඉතා ආකර්ෂනීය ගොඩනැගිල්ලක් වේ.

1922 විදුලියෙන් ක්‍රියාකරන යන්ත්‍රයක් යෙදවීමට නොහැකි සුළු නගර සඳහා හුළං මෝල් උපයෝගි කරගෙන ළිංවලින් ජලය පොම්ප කිරීමේ හැකියාව පිළිබඳ අත්හදා බැලීම 1922 වසරේ සිට කරගෙන යනු ලැබේ. ඒ අනුව හුළං මෝලක් පිටරටින් ගෙන්වා පිළියන්දල සවිකර ඇත. මුලදී අවට ගස්කොළන් එහි නිදහස් ක්‍රියාකාරීත්වයට බාධා කළ නමුත් ගස් ඉවත්කළ පසු එය හොඳින් ක්‍රියා කළේය.

1921 දි සුළු නගර සංවර්ධනය යටතේ මෙම නගරයේ තත්ත්වය මෙසේ සඳහන් වේ. විශේෂයෙන්ම මෙම තත්ත්වය

සෙනෙටර් බෝඩ් යටතෙහි පළාත්පාලනය අදාළ තත්ත්වයන් වේ.

එළවළු මාර්කට් 1යි, මාලු මාර්කට් 1ය, මස් කඩ 1යි, සාප්පු 5යි, මහජන වැසිකිළි 1යි, සෙනෙටර බෝඩ් මගින් පලානය වන පෞද්ගලික වැසිකිලි 18යි, කුණු කසල ගෙන යන කරත්ත 1ය, මළ පහ ගෙන යන කතරත්ත 1යි, කුණු කසල පවිත්‍ර කරන්නන් 1යි, මලපහ ගෙන යන්නන් 3යි, මාර්කට් කම්කරුවන් 1යි.

1920 දී බස්නාහිර පළාතේ ඒජන්තව සිටි ප්‍රේෂර් මහතා විසින් ආරම්භ කොට තිබුණු 'සැනටර් බෝඩ්' නමැති ඒකකය පසුකාලීනව මාම්පේ, කැස්බෑව ගම් සභාව බවට පත්විය. මෙම මාම්පේ කැස්බෑව ගම්සභාවෙහි ලේඛන ගත වූ සභාපතිවරුන් ලේඛනයක් මෙසේ දැක්විය හැකිය.

ජේ. ඒ. කුලතුංග මහතා - 1932.07.01 සිට 1933.06.30 දක්වා

ඇල්. ඩී. බී. වණිගසූරිය මහතා - 1933.07.01 සිට 1948.09.30 දක්වා

වී. ටී. සී. රත්නායක මහතා - 1948.10.01 සිට 1949.06.30 දක්වා

ඇල්. ඩී. ඕ. ඇලෙක්සැන්ඩර් මහතා - 1949.07.01 සිට 1953.06.30 දක්වා

සෝමවීර චන්ද්‍රසිරි මහතා - 1953.07.01 සිට 1958.09.29 දක්වා

ඩී. ඩී. කොරනිස් මහතා - 1958.09.30 සිට 1961.06.30 දක්වා

සෝමවීර චන්ද්‍රසිරි මහතා - 1961.07.01 සිට 1963.12.31 දක්වා

අසෝක පරණවිතාන මහතා - 1964.01.01 සිට 1964.06.30 දක්වා

පී. එස්. පෙරේරා මහතා - 1964.07.14 සිට 1969.06.30 දක්වා

සෝමවීර චන්ද්‍රසිරි මහතා - 1969.07.23 සිට 1971.01.15 දක්වා

සරත් ඇල්විටිගල මහතා - 1971

1980 අංක 38 දරණ දිස්ත්‍රික් සංවර්ධන සභා පනත යටතේ දිස්ත්‍රික් සංවර්ධන සභාවන්හි උප කාර්යාල බවට පත්විය. ඒ

අනුව මාම්පේ කැස්බෑව ගම් සභාවද කොළඹ දිස්ත්‍රික් සංවර්ධන සභාවෙහි කැස්බෑව උප කාර්යාලය බවට පත් විය. මෙම තත්ත්වය කෝට්ටේ - ගල්කිස්ස ගම්සභාවටද පොදු විය.

## 2. පිළියන්දල සුළු නගර සභාව

පිළියන්දල නගරය පාදක කරගත් පිළියන්දල සුළු නගර සභාව 1949 වසරේදී ස්ථාපිත විය. බස්නාහිර පළාත භාරව එවකට සිටි ආණ්ඩුවේ ඒජන්ත ප්‍රේෂර් මහතා මෙම කාර්යය සඳහා මූලික වී තිබේ. කොළඹ හොරණ මාර්ගයෙහි මනරම් කඳු ගැටයක් වූ පිළියන්දල එකළ පෙෂර් ටවුම වශයෙන් ද හඳුන්වන ලදි. නගරයට අවශ්‍ය මාර්ග අතුරු මාර්ග මනාව සැලසුම් කොට තිබූ අතර සතර දිසාවටම ජලය බැසයන කානු පද්ධතියක්ද මෙම ටවුමට අයත් විය. මෙම සුළු නගර සභාව 1987 දී ප්‍රාදේශීය සභාව ස්ථාපිත වන තෙක් ක්‍රියාත්මක විය.

## 3. දිස්ත්‍රික් සංවර්ධන සභා උප කාර්යාල

1980 අංක 35 දරණ දිස්ත්‍රික් සංවර්ධන සභා පනත මගින් එතෙක් පැවති සුළු නගර සභා හා ගම්සභා ක්‍රමය අහෝසි කොට දිස්ත්‍රික් සංවර්ධන සභාවක් ඒ ඒ පරිපාලන දිස්ත්‍රික්කය වෙනුවෙන් පිහිටුවන ලදී. ඒ අනුව එතෙක් පැවති සුළු නගර සභා හා ගම්සභා සියල්ල දිස්ත්‍රික් සංවර්ධන සභාවෙහි උප කාර්යාල බවට පත්විය. එබැවින් පහත සඳහන් උප කාර්යාල කැස්බෑව බල ප්‍රදේශය තුළ ස්ථාපිත විය.

1. කෝට්ටේ ගල්කිස්ස උප කාර්යාලය
2. පිළියන්දල උප කාර්යාලය
3. මාම්පේ කැස්බෑව උප කාර්යාලය

මෙම ආයතන ස්ථාපිත වීමේදී පෙර පැවති පළාත් පාලන ඒකක අහෝසි විය. ඒ අනුව කෝට්ටේ - ගල්කිස්ස ගම් සභාව කොළඹ දිස්ත්‍රික් සංවර්ධන සභාවේ කෝට්ටේ - ගල්කිස්ස උප කාර්යාලය විය. එමෙන්ම මාම්පේ කැස්බෑව ගම් සභාවල

මාම්පේ කැස්බෑව උප කාර්යාලය විය. එමෙන්ම පිළියන්දල නගරය ආවරණය වූ පිළියන්දල සුළු නගර සභාව පිළියන්දල උප (නගර) කාර්යාලය විය.

## 4. කැස්බෑව ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභා ක්‍රමය ස්ථාපිත විය. එහි ප්‍රතිඵලයක් ලෙස කැස්බෑව ප්‍රාදේශීය සභාව නමැති පළාත් පාලන ආයතනයද නිර්මාණය විය. 1988 ජනවාරි 01 දින සිට මෙම ප්‍රාදේශීය සභාව ක්‍රියාත්මක විය.

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ක්ෂේත්‍රයෙහි වැදගත් සිදුවීම් රැසක් 1980 දශකය තුළ සිදුවිය. එනම් පළාත් පාලන ක්ෂේත්‍රයෙහි ක්‍රමානුකූල වර්ධනයක් සිදු විය. ඒ අනුව පළාත් පාලන ගැටලු අධ්‍යයනය කර ප්‍රතිසංස්කරණ සිදුකිරීම සඳහා විශේෂයෙන් ආදායම් ප්‍රවර්ධනය උදසා කමිටු ගණනාවක්ම පිහිටුවන ලදී.

1. 1980 සංවර්ධන සභාවල ප්‍රාථමික මට්ටමේ ජනතා සහභාගිත්වය ලබාගැනීම සඳහා ආචාර්ය එච්. ඒ. පී. අභයවර්ධන කමිටු වාර්තාව.

2. 1980 දිස්ත්‍රික් සංවර්ධන සභා පිහිටුවීම පිළිබඳව ජනාධිපති කොමිෂන් සභාව.

3. 1986 රාජ්‍ය කටයුතු සඳහා ජනතා සහභාගිත්වය ලබා ගැනීම සඳහා යෝග්‍ය ආයතන සංවිධාන පිළිබඳ වාර්තාව.

4. 1987 බලය පවරාදීම නිසා ඇති වන පරිපාලන වෙනස්කම් විභාග කිරීමේ එම්. එස්. වනසිංහ පරිපාලන සංශෝධන කමිටු වාර්තාව.

මෙම කමිටු හා වාර්තාවලින් පළාත් පාලනය පිළිබඳ විවිධ යෝජනා හා නිර්දේශ ඉදිරිපත් විය. 1986 දී රාජ්‍ය කටයුතු සඳහා පත්කළ ඇමැති අනුකාරක කමිටුව විසින් එවක පැවැති ප්‍රාදේශීය ආදායම් පාලක / උප දිසාපති කොට්ඨාශ පදනම් කරගනිමින් පළාත් පාලන ව්‍යුහයක් ඇති කිරීමට නිර්දේශ විය. ඒ අනුව මහ

නගර සභා හා නගර සභා යටතට නොගැනෙන ප්‍රදේශ සඳහා ප්‍රාදේශීය සභා ස්ථාපිත කෙරුණි. එනම් මේ වන විට පැවැති සුළු නගර සභා හා ගම්සභා වෙනුවට එක් උප දිසාපති කොට්ඨාශයකට එකක් බැගින් වූ ප්‍රාදේශීය සභා 257ක් ස්ථාපනය විය.

ප්‍රාදේශීය සභා පනත හඳුන්වාදීමේ පරමාර්ථය වූයේ පරිපාලන සංවර්ධන කටයුතුවලට අදාළ තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ජනතාවට ප්‍රාදේශීය මට්ටමින් ඵලදායි ලෙස සහභාගි වීම සඳහා ජනතාවට වැඩි අවස්ථා සළසාදීම අරමුණු ඇතිව ප්‍රාදේශීය සභා පිහිටුවීම සඳහා ද එම සභාවල බලතල කාර්යයන් හා කර්තව්‍යයන් නිශ්චය කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ අනුශාංගික සියලු විධිවිධාන සැලැස්වීමය. ප්‍රාදේශීය සභා පනතෙහි අන්තර්ගතයට එහි සංස්ථාපනය, නිල තත්ත්වය, මංමාවත්වලට අදාළ බලතල හා කාර්යයන්, මහජන සෞඛ්‍ය පිළිබඳවද බලතල හා කාර්යය, මුදල් කටයුතු, ප්‍රාදේශීය සභා අධීක්ෂණ හා පාලනය, පරිපූරක විධිවිධාන මෙන්ම සාමාන්‍ය කරුණු ද ඇතුළත් විය.

කැස්බෑව ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීමේදී කෝට්ටේ - ගල්කිස්ස උප කාර්යාලයට (කලින් කෝට්ටේ - ගල්කිස්ස ගම් සභාව) අයත්ව තිබූ මිරිහාන, මාදිවෙල, උඩහමුල්ල, තලපත්පිටිය, දෙපානම, පන්නිපිටිය සහ පමුණුව යන කොට්ඨාශ පහ මහරගම ප්‍රාදේශීය සභාවට එකතු විය.

ඒ අනුව 1991 - 1993 කාල සීමාව තුළ ගාමිණී තිලකසිරි මහතා ද 1993 - 1997 කාලයේදී ආර්. එම්. සුසිල් ප්‍රේමචන්ද්‍ර මහතා ද 1997 - 2002 කාල පරාසය තුළ කේ. ගාමිණී ද සිල්වා මහතා ද ඉන් අනතුරුව 2006 දක්වා ටී. ඒ. ඩී. ආරියදාස මහතා ද මෙම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති තනතුරු දරන ලදී. මහජන නියෝජිතයන් නොමැති කාලසීමාවන්හි ප්‍රාදේශීය සභාව විශේෂ කොමසාරිස්වරුන්ගේ පාලනයට යටත් කර තිබුණි. ඒ අනුව උප දිසාපති / ප්‍රාදේශීය ලේකම් තනතුරු දැරූ (1988 - 1990) එච්. ඩබ්. පී. පී. විජේතිලක මහතා ද, (1990 - 1991) කේ.

ඒ. තිලකරත්න මහතා ද, (1992) එස්. විරිතමුල්ල මහතා ද, 1997 දී ආනන්ද ලොකුරණමුක මහතා ද, (2002) ජී. ඩී. ප්‍රේමරත්න මහතා (ප්‍රාදේශීය සභාවේ ලේකම්) ද, 2006 වර්ෂයේදී අයි. ආර්. සෝමසිරි මහතා ද එහි පාලන කටයුතු මෙහෙයවීය.

## 4. කැස්බෑව නගර සභාව

මහ නගර ස්ථාපිතවීම ප්‍රධාන වශයෙන් කොළඹ දිස්ත්‍රික්කය ආශ්‍රිතව සිදුවී තිබේ. ජනගහනය හා නාගරීකරණය ඊට ප්‍රධානතම සාධකය විය. ඒ අනුව කොළඹ, දෙහිවල, මොරටුව, ශ්‍රී ජයවර්ධනපුර මෙන්ම කඩුවෙල ද කාලානුරූපව මහ නගර සභා බලප්‍රදේශ බවට පත් විය. මහ නගර සභාවන්ට වඩා අඩු එහෙත් නාගරීකරණයට ලක් වූ කොළඹ දිස්ත්‍රික්කයේ අනෙකුත් පළාත් පාලන ඒකක ද කාලානුරූපව නගර සභා බවට පත් වී ඇත. පෑලියගොඩ, කොළොන්නාව, මහරගම, සීතාවක, බොරලැස්ගමුව හා කැස්බෑවද එසේ නාගරීකරණය හේතුකොටගෙනම පසුකාලීනව නගර සභා බවට පත් වූ පළාත් පාලන ඒකක වේ.

නගර සභා ස්ථාපනයට අදාළ නගර සභා ආඥා පනත හඳුන්වාදීමේ පරමාර්ථය වූයේ ශ්‍රී ලංකාවේ පළාත් පාලන කාර්යය සඳහා නගර සභා පිහිටුවීම පිණිස විධිවිධාන සැලැස්වීම වේ. එම පනතෙහි අන්තර්ගතය තුළ නගර සභා ස්ථාපනය කිරීම, එහි බලතල හා කාර්යය, මංමාවත් පිළිබඳ බලතල හා කාර්යය, මහජන සෞඛ්‍ය පිළිබඳ බලතල හා යුතුකම්, මහජනෝපකාර සේවා, අතුරු ව්‍යවස්ථා, මූල්‍ය කටයුතු, මධ්‍ය පාලනය, සාමාන්‍ය කරුණු මෙන්ම ඉවත්කිරීම, පවත්නා නීති අදාළ කිරීම, අන්තර් කාලීන විධිවිධාන සහ විවිධ විධිවිධාන යන කරුණු ඇතුළත් වේ.

2006 වසර වන විට නගර සභාවක් තත්ත්වයට අවශ්‍ය කරන නාගරීකරණය කැස්බෑවට ළඟා වී තිබුණි. කොළඹ දිස්ත්‍රික්කයෙහි හරි අඩක් පමණ නියෝජනය වන කොළඹ, දෙහිවල, මොරටුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මෙන්ම පසුව කඩුවෙල කොට්ඨාශ මේ වන විට මහ නගර සභා බවට පරිවර්ථනය වී තිබුණි. කොළොන්නාව, සීතාවක, මහරගම යන

පළාත් පාලන ඒකක නගර සභා බවට පත්ව තිබුණි. එවැනි අවශ්‍යතාව සැලකිල්ලට ගෙන කැස්බෑව ප්‍රාදේශීය සභාව ද වෙනස්වීම කිහිපයකට භාජනය විය. එනම්,

1. බොරලැස්ගමුව හා කැස්බෑව යනුවෙන් පළාත් පාලන ඒකක 02ක් බිහිවීම.

2. බොරලැස්ගමුව මෙන්ම කැස්බෑවද නගර සභා බවට පරිවර්ථනය වීම.

3. කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පරිපාලන ඒකකයට සමාන ලෙස ස්ථාපිතව පැවති කැස්බෑව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ද දෙකඩ විය. ඒ අනුව මුළු ග්‍රාමසේවා වසම් සංඛ්‍යාව වූ ප්‍රමාණය ද යළි දෙකඩ විය.
   - කැස්බෑව නගර සභාවට ආවරණය වන ග්‍රාම නිලධාරී කොට්ඨාශය සංඛ්‍යාව 55
   - බොරලැස්ගමුව නගර සභාව ආවරණය වන ග්‍රාම නිලධාරි කොට්ඨාශ සංඛ්‍යාව 18

4. මහජන නියෝජිත සංඛ්‍යාවද වෙනසකට භාජනය විය.
   - කැස්බෑව නගර සභාව නාගරික මන්ත්‍රී සංඛ්‍යාව 17
   - බොරලැස්ගමුව නගර සභාව නාගරික මන්ත්‍රී සංඛ්‍යාව 09

කැස්බෑව නගර සභාවේ ආරම්භක සභාපති ධූරය ලෙනාඞ් කරුණාරත්න මහතාට (2006 - 2010) හිමි විය. ඉන් අනතුරුව ලක්ෂමන් පෙරේරා මහතා (2011 - 2013) ද, සුමන විවියන් රණවීර මහතා (2013 - 2015) ද, එමෙන්ම යළිත් (2018 සිට) ලක්ෂ්මන් පෙරේරා මහතාට ද එම ධූරය දැරීමට අවස්ථාව උදා විය. මහජන නියෝජිතයන් නොතිබුණු 2010 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් එල්. ඒ. කළුකපුආරච්චි මහතා විශේෂ කොමසාරිස් ධූරය හෙබවිය. එමෙන්ම 2016 - 2018 කාලසීමාව තුළ කේ. තරංගා ගම්ලත් මිය ලේකම් හා සභාවේ බලතල, කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි ලෙස කටයුතු කරන ලදී.

කැස්බෑව නගර සභා ක්‍රියාකාරිත්වය මේ වන විට වර්ෂ 13ක් ඉක්මවා ගොස් තිබේ. එම කාලසීමාව තුළ මුළු බල ප්‍රදේශයම ආවරණය වන පරිදි වරිපනම් බදු පැනවීම, පිළියන්දල නගරයට නව නගර සැලැස්මක් නිර්මාණය වීම, මාර්ග පද්ධතිය නවීකරණය, බොල්ගොඩ වාරිමාර්ග පද්ධතිය වර්ධනය, නව ආයතන ව්‍යුහයක් බිහිවීම, පිළියන්දල වානිජ නගරයක් බවට පත්වීම ප්‍රධාන කොට දැක්විය හැකිවේ. කෙසේ වෙතත් නාගරීකරණය හේතුවෙන් ඉවත ලන දෑ වර්ධනය වීම, ඝණ අපද්‍රව්‍ය ප්‍රමාණය වේගයෙන් ඉහළ යාම මෙන්ම කරදියාන කුණු කන්ද නිර්මාණය වීම සමාජමය ගැටලු වශයෙන් පෙන්නුම් කළ හැකිවේ.

කොළඹ දිස්ත්‍රික්කයෙහි ජනගහනය ආකර්ශනය වන නගරයක් වශයෙන් පිළියන්දල හැඳින්විය හැකිය. ඒ නිසාම මෙම ප්‍රදේශයට බාහිර ප්‍රදේශවලින් පදිංචියට වැඩි වැඩියෙන් ජනතාව ඇදී එමින් පවතී. 2018 නව පළාත් පාලන මැතිවරණ ක්‍රමයට අනුව මන්ත්‍රී කොට්ඨාශ සංඛ්‍යාව 20ක් වශයෙන් ද මහජන නියෝජිතයින් 35 දෙනෙකුගෙන් ද නගර සභා සමන්විත විය.

1973 සිටම කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ස්ථාපිතව පැවතුණි. කැස්බෑව සහ බොරලැස්ගමුව බල ප්‍රදේශ මෙම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට සමාන විය. 2006 දී කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළම කැස්බෑව හා බොරලැස්ගමුව ලෙස නගර සභා ස්ථාපිත විය. මෙම සියලු ඒකක කැස්බෑව මැතිවරණ කොට්ඨාශ බල ප්‍රදේශයට සමාන වේ. එහි දේශපාලන අධිකාරිය වත්මන් පාර්ලිමේන්තු මන්ත්‍රී ගාමිණී ලොකුගේ මැතිතුමාට හිමි වී තිබේ. ඉතා දීර්ඝ කාලීන හා පරිනත දේශපාලනඥයකු වූ ගාමිණී ලොකුගේ මැතිතුමාගේ මගපෙන්වීම හා උපදෙස් මත කැස්බෑව මෙන්ම බොරලැස්ගමුව නගර සභා ද ක්‍රියාත්මක වීම සුවිශේෂී කරුණක් වේ. ඔහුගේ මැදිහත්වීම මෙම නගර සභා බලප්‍රදේශයන් හි දියුණුවට සුවිශේෂී දායකත්වයක් විය.

# කැස්බෑව නගර සභාව මහජන නියෝජනය 4

නිදහස ලැබීමට පෙර සිටම කැස්බෑව පළාත් පාලන ඒකකයෙහි මහජන නියයෝජනය පහත සඳහන් පරිදි විය.

## 1. මාම්පේ - කැස්බෑව ගම් සභාව

(සීමා පලකයක් ඇසුරෙණි)

| | |
|---|---|
| ජේ. ඒ. කුලතුංග මහතා | - 1932.07.01 සිට 1933.06.30 දක්වා |
| ඇල්. ඩී. බී. වණිගසූරිය මහතා | - 1933.07.01 සිට 1948.09.30 දක්වා |
| වී. ටී. සී. රත්නායක මහතා | - 1948.10.01 සිට 1949.06.30 දක්වා |
| ඇල්. ඩී. ඕ. ඇලෙක්සැන්ඩර් මහතා | - 1949.07.01 සිට 1953.06.30 දක්වා |
| සෝමවීර චන්ද්‍රසිරි මහතා | - 1953.07.01 සිට 1958.09.29 දක්වා |
| ඩී. ඩී. කොරනිස් මහතා | - 1958.09.30 සිට 1961.06.30 දක්වා |
| සෝමවීර චන්ද්‍රසිරි මහතා | - 1961.07.01 සිට 1963.12.31 දක්වා |
| අසෝක පරණවිතාන මහතා | - 1964.01.01 සිට 1964.06.30 දක්වා |
| පී. එස්. පෙරේරා මහතා | - 1964.07.14 සිට 1969.06.30 දක්වා |
| සෝමවීර චන්ද්‍රසිරි මහතා | - 1969.07.23 සිට 1971.01.15 දක්වා |
| සරත් ඇල්විටිගල මහතා | - 1971 |

## 2. පිළියන්දල සුළු නගර සභාව

(1947.01.17 දින සභා වාර්තාව)

**සභාපති** - **ඇම්. ඇල් ෆොන්සේකා මහතා**

**උප සභාපති** - **එච්. ඩබ්. බී. විජයනන්දන මහතා**

නියෝජිත - සෝමවීර චන්ද්‍රසිරි මහතා

නියෝජිත - ඩේවිඩ් විජේසිංහ මහතා

නියෝජිත - ඇල්. ඩී. බී. වනිගසූරිය මහතා

නියෝජිත - චාර්ල්ස් විජයනන්දන මහතා

## 3. පිළියන්දල සුළු නගර සභාව

(1973.09.18 දින සභා වාර්තාව)

**සභාපති** - **සාමවිනිසුරු දයා කුලරත්න මහතා**

**උප සභාපති** - **සාමවිනිසුරු ඩී. ඩී. කොරනිස් මහතා**

නියෝජිත - සාමවිනිසුරු ඩී. වටරැක මහතා

නියෝජිත - බී. ඩී. සෝමපාල මහතා

# 4. කැස්බෑව ප්‍රාදේශීය සභාව
(1991 - 1993)

| | | |
|---|---|---|
| **සභාපති** | - | **අන්දරගේ දොන් ගාමිණී තිලකසිරි මහතා** |
| **උප සභාපති** | - | **හඳරාගමගේ දොන් සුනිල් ජයමිණි මහතා** |
| සභිකයින් | - | දොන් ඒමිස් පෙරියප්පෙරුම මහතා |
| සභිකයින් | - | නීලවල ගෙදර ගාමිණී කුමාරරත්න මහතා |
| සභිකයින් | - | රඹුක්කන මග්ගොනගේ සුසිල් ප්‍රේමචන්ද්‍ර මහතා |
| සභිකයින් | - | අඹේගොඩ ලියනගේ දෝන ජයවතී මහත්මිය |
| සභිකයින් | - | මද්දුමාගේ ආරියදාස පෙරේරා මහතා |
| සභිකයින් | - | නාකන්දලගේ දොන් ජයපාල මහතා |
| සභිකයින් | - | ජාසිංහගේ දොන් සලමන් මහතා |
| සභිකයින් | - | කෝරාළලාගේ දෝන රසිකා ප්‍රියදර්ශනී මෙනවිය |
| සභිකයින් | - | පනාගොඩගේ දොන් සිරිලාල් මහතා |
| සභිකයින් | - | බර්ටි ඇස්කි මහතා |
| සභිකයින් | - | නන්දසේන ජයවීර මහතා |
| සභිකයින් | - | තනිප්පුලි අච්චිගේ දොන් ආරියදාස මහතා |
| සභිකයින් | - | නන්දසේන අමරසිංහ මහතා |
| සභිකයින් | - | මහින්ද කුමාර විජේරත්න මහතා |
| සභිකයින් | - | මෙරිංඤ්ඤගේ බර්නාඩ් රම්‍ය කුමාර ද කොස්තා මහතා |
| සභිකයින් | - | අශෝක පරණවිතාන මහතා |
| සභිකයින් | - | යහම්පත් අච්චගේ සුගතදාස මහතා |
| සභිකයින් | - | හොල්ලු පතිරගේ රණසිංහ කල්දේරා මහතා |
| සභිකයින් | - | කිරිමන්තුඩුව රාළලාගේ ප්‍රේමවර්ධන අබේරත්න මහතා |
| සභිකයින් | - | ප්‍රසන්න කපිල හෙට්ටිගේ මහතා |
| සභිකයින් | - | අත්තිඩි විදානලාගේ ටෙරන්ස් ප්‍රේමලාල් පෙරේරා මහතා |

# 5. කැස්බෑව ප්‍රාදේශීය සභාව

(1993 - 1997)

**සභාපති** - **ආර්. එම්. සුසිල් ප්‍රේමචන්ද්‍ර පෙරේරා මහතා**

**උප සභාපති** - **ඒ. එල්. ඩී. ජයවතී මහත්මිය**

ප්‍රා. ස. මන්ත්‍රී - ඩී. ඊ. පේරියප්පෙරුම මහතා

ප්‍රා. ස. මන්ත්‍රී - එන්. ගාමිණී කුමාරරත්න මහතා

ප්‍රා. ස. මන්ත්‍රී - එන්. ඩී. ජයපාල මහතා

ප්‍රා. ස. මන්ත්‍රී - ජේ. ඩී. සලමන් මහතා

ප්‍රා. ස. මන්ත්‍රී - කේ. ඩී. රසිකා ප්‍රියදර්ශනී මෙනවිය

ප්‍රා. ස. මන්ත්‍රී - පී. ඩී. සිරිලාල් මහතා

ප්‍රා. ස. මන්ත්‍රී - නන්දසේන ජයවීර මහතා

ප්‍රා. ස. මන්ත්‍රී - කේ. ඩී. අරුණ ප්‍රියශාන්ත මහතා

ප්‍රා. ස. මන්ත්‍රී - එම්. ඩී. ප්‍රේමදාස මහතා

ප්‍රා. ස. මන්ත්‍රී - නන්දසේන අමරසිංහ මහතා

ප්‍රා. ස. මන්ත්‍රී - මහින්ද කුමාර විජේරත්න මහතා

ප්‍රා. ස. මන්ත්‍රී - අසෝක පරණවිතාන මහතා

ප්‍රා. ස. මන්ත්‍රී - ඩී. ජී. ඩොඩ්වෙල් අල්විස් මහතා

ප්‍රා. ස. මන්ත්‍රී - එච්. ආර්. කල්දේරා මහතා

ප්‍රා. ස. මන්ත්‍රී - කේ. ඩී. පී. අභයරත්න මහතා

ප්‍රා. ස. මන්ත්‍රී - ප්‍රසන්න කපිල හේට්ටිගේ මහතා

ප්‍රා. ස. මන්ත්‍රී - ඒ. වී. ටෙරන්ස් පේමලාල් පෙරේරා මහතා

## 6. කැස්බෑව ප්‍රාදේශීය සභාව

(1997 - 2002)

| | | |
|---|---|---|
| **සභාපති** | - | **කේ. ගාමිණී ද සිල්වා මහතා** |
| **උප සභාපති** | - | **කේ. ඩී. රසිකා ප්‍රියදර්ශනී මහත්මිය** |
| ප්‍රා. ස. මන්ත්‍රී | - | සුභාෂ් චන්ද්‍රසිරි මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - | ජයපාල නාකන්දල මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - | ඒ. එල්. ඩී. ජයවතී මහත්මිය |
| ප්‍රා. ස. මන්ත්‍රී | - | ඒ. කරුණාපල මුහන්දිරම් මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - | කේ. ඩී. අරුණ ප්‍රියශාන්ත මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - | ඩග්ලස් සිරිවර්ධන මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - | සුමන විවියන් රණවීර මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - | නන්දසේන පතිරගේ මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - | ඒ. මයිකල් පෙරේරා මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - | ප්‍රසන්න කපිල හෙට්ටිගේ මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - | බර්ටි ඇස්කි මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - | අජන්ත නිරෝෂන් පාදුක්ක මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - | ටී. ඒ. ඩී. ආරියදාස මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - | කේ. ඒ. ඩී. හේමසිරි මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - | මහින්ද කුමාර විජේරත්න මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - | ඒ. ඇල්ප්‍රඩ් අල්විස් සමරකෝන් මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - | එච්. රණසිංහ කල්දේරා මහතා |

## 7. කැස්බෑව ප්‍රාදේශීය සභාව

(2002 - 2006)

| | |
|---|---|
| **සභාපති** | - **ටී. ඒ. ඩී. ආරියදාස මහතා** |
| **උප සභාපති** | - **අජන්ත නිරෝෂන් පාදුක්ක මහතා** |
| ප්‍රා. ස. මන්ත්‍රී | - මහින්ද කුමාර විජේරත්න මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - ඩී. ජී. ඩොඩ්වෙල් අල්විස් මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - කේ. ඒ. ඩී. හේමසිරි මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - එම්. ටෙනිල් රත්නසිරි ප්‍රනාන්දු මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - නන්දසේන අමරසිංහ මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - එම්. ඒ. කරුණාරත්න පෙරේරා මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - පී. ඒ. ඩී. තුෂාර ප්‍රියන්ත මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - දිපාල් ප්‍රසන්න වීරසිංහ ගුණවර්ධන මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - චන්ද්‍රසේන කොඩිතුවක්කු මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - කේ. ඩී. රසිකා ප්‍රියදර්ශනී මහත්මිය |
| ප්‍රා. ස. මන්ත්‍රී | - අරුණ ප්‍රියශාන්ත මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - කේ. ගාමිණී ද සිල්වා මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - කරුණාපාල මුහන්දිරම්ආරච්චි මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - සුමන විවියන් රණවීර මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - ගර්මන් කුලසිරි වටරැක මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - ශ්‍රී ලාල් සිගේරා මහතා |
| ප්‍රා. ස. මන්ත්‍රී | - එච්. ටී. ඔලිවර් පෙරේරා මහතා |

# 8. කැස්බෑව නගර සභාව

කැස්බෑව නගර සභාව ස්ථාපිත කිරීමේ ගැසට් නිවේදනය 2006.01.04 දින නිකුත් විය. එම ගැසට් නිවේදනය තුළින් පහත සඳහන් විධිවිධාන පනවන ලදී.

එම නියමය තුළින් නගර සභා ආඥාපනතට අනුව කැස්බෑව නගරයක් බවත්, එම නගරයේ පරිපාලන සීමාවන් නියම කිරීමත් එමෙන්ම කැස්බෑව නගර සභාවේ සභික සංඛ්‍යාව තීරණය කිරීම හා නගර සභාවේ නිල කාලය ආරම්භ වන දිනය ප්‍රකාශයට පත් කර ඇත.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති. විශේෂ**

**අංක 1426/15 - ජනවාරි 04 වැනි බදාදා - 2006.01.04**

**IV (ආ) වැනි කොටස - පළාත් පාලනය**

**පළාත් පාලන නිවේදන**

**නගර සභා ආඥාපනත**

**නියමය**

නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 2, 3, 5 සහ 9 වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙම නියමයන්,

(1) මෙහි උපලේඛනයේ I වන කොටසේ නිරූපිත ප්‍රදේශය එම ආඥාපනතේ කාර්යයන් සඳහා නගරයක් විය යුතු යැයි ප්‍රකාශ කරමි.

(2) එම උපලේඛනයේ II වන කොටසේ නිරූපිත සීමා, එම නගරයේ පරිපාලන සීමා ලෙස නියම කරමි.,

(3) මෙම නියමයෙහි (I) වන ඡේදය යටතේ ප්‍රකාශිත නගරය සඳහා නගර සභාවක් සංස්ථාපනය කර ඒ නගර සභාවට පහත සඳහන් නාමය සහ අභිධානය පවරමි,

''කැස්බෑව නගර සභාව''

(4) කැස්බෑව නගර සභාව, සභාපතිවරයෙකු, උප සභාපතිවරයකු සහ වෙනත් තෝරා පත් කරගත් සභිකයින් පහළොස් දෙනෙකුගෙන් සමන්විත විය යුතු යැයි නියම කරමි;

(5) කැස්බෑව නගර සභාවේ නිල කාලය ආරම්භ විය යුතු දිනය 2006 අප්‍රේල් මස පහලොස් වන දිනය වශයෙන් නියම කරමි.

**ජනක බණ්ඩාර තෙන්නකෝන්,**
**පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය,**
**2005 දෙසැම්බර් මස 30 වැනි දින**

## උපලේඛනය

### I වන කොටස

පහත සඳහන් ග්‍රාම නිලධාරී කොට්ඨාශවලින් සමන්විත භූමි ප්‍රදේශයː

(562) වැවල නැගෙනහිර, (562ඒ) සුවාරපොල, (562බී) වැවල බටහිර, (562සී) සුවාරපොල බටහිර, (563) හැඩිගම, (564) දූල්තර බටහිර, (564ඒ) දූල්තර නැගෙනහිර, (565) බටකැත්තර උතුර, (565ඒ) බටකැත්තර දකුණ, (566) දම්පේ. (567) මඩපාත, (568) මොරැඳ, (568ඒ) නිවුන්ගම, (569) මාකන්දන නැගෙනහිර, (569ඒ) මාකන්දන බටහිර, (570) හල්පිට, (571ඒ) හොරතුඩුව, (572) කැස්බෑව උතුර, (572ඒ) කැස්බෑව දකුණ, (572බී) කැස්බෑව නැගෙනහිර, (573) කොළමුන්න, (574) මාම්පේ බටහිර, (574ඒ) මාම්පේ උතුර, (574බී) විශ්වකලාව, (574සී) මාම්පේ දකුණ, (574ඩී) මාම්පේ නැගෙනහිර, (575) බොකුන්දර, (576) තුම්බෝවිල බටහිර, (576ඒ) ඇරැව්වල බටහිර, (581බී) බංගලාවත්ත, (581සී) රත්මල්දෙනිය, (581ඩී) ඇරැව්වල උතුර, (581ඊ) මහල්වරාව, (582) පැලැන්වත්ත උතුර, (582ඒ) පැලැන්වත්ත බටහිර, (582බී) පැලැන්වත්ත නැගෙනහිර, (583) මකුළුදූව, (583ඒ) පලිගෙදර, (584) ගොරකපිටිය, (584ඒ) නාම්පමුණුව, (585) හොන්නන්තර උතුර, (585ඒ) හොන්නන්තර දකුණ, (586) මාවිතර දකුණ, (586ඒ) මාවිතර උතුර, (596) බටුවන්දර උතුර, (596ඒ) බටුවන්දර දකුණ, (597) ජම්බුරලිය, (598) කහපොල, (598ඒ) රෙජිඩෙල්වත්ත, (598බී) පොල්හේන.

### I වන කොටස

### කැස්බෑව නගර සභාවේ පරිපාලන සීමාː-

උතුරට - මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නැගෙනහිර මායිම බොරලැස්ගමුව පොලිස් බල ප්‍රදේශයේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යයෙන් පටන්ගෙන එම දකුණු මායිම ඔස්සේ කිලෝමීටර් 2.7 ක් ඊසාන දෙසට ගොඩිගමුව දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාශ මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන්

සිට මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දකුණු මායිම ඔස්සේ කිලෝමීටර් 3.8ක් ඊසාන දෙසට කොට්ඨාව නගර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද, එතැන් සිට එම මායිම ඔස්සේ කිලෝමීටර් 2.2ක් ගිනිකොන දෙසට එය හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද,

නැගෙනහිරට - ඉහත අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට කිලෝමීටර් 3.8ක් නිරිත දෙසට කුඩමාදූව ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මායිම ඔස්සේ කිලෝමීටර් 2.6ක් ගිනිකොන දෙසට අම්බලන්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාශ හමුවන ලක්ෂය දක්වාද, එතැන් සිට හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මායිම ඔස්සේ කිලෝමීටර් 2.8ක් නිරිත දෙසට කළුතර දිස්ත්‍රික්කයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද,

දකුණට - ඉහත අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට කළුතර දිස්ත්‍රික්කයේ උතුරු මායිම ඔස්සේ කිලෝමීටර් 2.3 ක් බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද, එතැන් සිටි කළුතර දිස්ත්‍රික් මායිම ඔස්සේ කිලෝමීටර් 4.1ක් වයඹ දෙසට මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද,

බටහිරට - ඉහත අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නැගෙනහිර මායිම ඔස්සේ උතුරු දෙසට කිලෝමීටර් 5.2ක් ආරම්භක ලක්ෂ්‍යය දක්වා ද වේ.

මේ අනුව කැස්බෑව නගර සභාවට ප්‍රථම වතාවට තේරී පත් වූ සභාපති / උප සභාපති හා සභික සංඛ්‍යාව පහත දැක්වේ.

## කැස්බෑව නගර සභාව

(2006 - 2010)

**සභාපති** - **පී. ඩී. එල්. ලෙනාඩ් කරුණාරත්න මහතා**

**උප සභාපති** - **ටී. ඒ. ඩී. ආරියදාස මහතා**

නගර සභා මන්ත්‍රී - ධර්මදාස පණ්ඩිතරත්න මහතා

නගර සභා මන්ත්‍රී - කේ. ඒ. ඩී. හේමසිරි මහතා

නගර සභා මන්ත්‍රී - පී. ඒ. ඩී. තුෂාර ප්‍රියන්ත මහතා

නගර සභා මන්ත්‍රී - එම්. ටෙනිල් රත්නසිරි මහතා

නගර සභා මන්ත - කොඩිතුවක්කු ආරච්චිගේ චන්ද්‍රසේන මහතා

නගර සභා මන්ත්‍රී - ඩී. එම්. ඩී. සමන් ප්‍රසන්න මහතා

නගර සභා මන්ත්‍රී - කේ. ගාමිණී ද සිල්වා මහතා

නගර සභා මන්ත - සුමන විවියන් රණවීර මහතා

නගර සභා මන්ත්‍රී - ගර්මන් කුලසිරි වටරැක මහතා

නගර සභා මන්ත්‍රී - කරුණාපාල මුහන්දිරම්ආරච්චි මහතා

නගර සභා මන්ත්‍රී - ඒ. එල්. ඩී. ජයවතී මහත්මිය

නගර සභා මන්ත්‍රී - අසිත රණසිංහ මහතා

නගර සභා මන්ත්‍රී - කේ. ගිහාන් විජේරත්න මහතා

නගර සභා මන්ත්‍රී - චමින්ද කුමාර සුදසිංහ මහතා

නගර සභා මන්ත්‍රී - සමන් සුජීව මාවතගේ මහතා

## 9. කැස්බෑව නගර සභාව

(2011 - 2013)

**සභාපති** - **ලක්ෂමන් පෙරේරා මහතා**

**උප සභාපති** - **එම්. හේමාල් ධර්මප්‍රිය මහතා**

නගර සභා මන්ත්‍රී - සුමන විවියන් රණවීර මහතා

නගර සභා මන්ත්‍රී - ධර්මදාස පණ්ඩිතරත්න මහතා

නගර සභා මන්ත්‍රී - කේ. නිදර්ශනී ද සිල්වා මෙනවිය

නගර සභා මන්ත්‍රී - කරුණාපාල මුහන්දිරම් ආරච්චි මහතා

නගර සභා මන්ත්‍රී - ලලිත් රෝහන ලියනගේ මහතා

නගර සභා මන්ත්‍රී - ගර්මන් කුලසිරි වටරැක මහතා

නගර සභා මන්ත්‍රී - චමින්ද කුමාර සුදසිංහ මහතා

නගර සභා මන්ත්‍රී - කල්ප තුෂාන්ත පෙරේරා මහතා

නගර සභා මන්ත්‍රී - පි. ඩී. එල්. ලෙනාඩ් කරුණාරත්න මහතා

නගර සභා මන්ත්‍රී - එම්. ටෙනිල් රත්නසිරි ප්‍රනාන්දු මහතා

නගර සභා මන්ත්‍රී - ටී. ඒ. ඩී. තුෂාර ප්‍රියන්ත මහතා

නගර සභා මන්ත්‍රී - කේ. ඒ. ඩී. හේමසිරි මහතා

නගර සභා මන්ත්‍රී - ඩී. එම්. ඩී. සමන් ප්‍රසන්න මහතා

නගර සභා මන්ත්‍රී - චන්ද්‍රසේන කොඩිතුවක්කු මහතා

## 10. කැස්බෑව නගර සභාව

(2013 - 2015)

**සභාපති** - **සුමන විවියන් රණවීර මහතා**

**උප සභාපති** - **එම්. හේමාල් ධර්මප්‍රිය මහතා**

නගර සභා මන්ත්‍රී - ලක්ෂ්මන් පෙරේරා මහතා

නගර සභා මන්ත්‍රී - ධර්මදාස පණ්ඩිතරත්න මහතා

නගර සභා මන්ත්‍රී - කේ. නිදර්ෂනී ද සිල්වා මෙනවිය

නගර සභා මන්ත්‍රී - කරුණාපාල මුහන්දිරම් ආරච්චි මහතා

නගර සභා මන්ත්‍රී - ලලිත් රෝහණ ලියනගේ මහතා

නගර සභා මන්ත්‍රී - ගර්මන් කුලසිරි වටරැක මහතා

නගර සභා මන්ත්‍රී - චමින්ද කුමාර සුදසිංහ මහතා

නගර සභා මන්ත්‍රී - කල්ප තුෂාන්ත පෙරේරා මහතා

නගර සභා මන්ත්‍රී - මොහාන් ලාල් නානායක්කාර මහතා

නගර සභා මන්ත්‍රී - එම්. ටෙනිල් රත්නසිරි මහතා

නගර සභා මන්ත්‍රී - කේ. ඒ. ඩී. හේමසිරි මහතා

නගර සභා මන්ත්‍රී - ඩී. එම්. ඩී. සමන් ප්‍රසන්න මහතා

නගර සභා මන්ත්‍රී - කේ. ඒ. චන්ද්‍රසේන කොඩිතුවක්කු මහතා

නගර සභා මන්ත්‍රී - චාමර මද්දුමකළුගේ මහතා

# 11. කැස්බෑව නගර සභාව

(2018)

2006 වසරේදී ප්‍රකාශිත අංක 1426/15 දරණ ගැසට් නිවේදනය 2017 අප්‍රේල් 07 දින යළි සංශෝධනය කෙරුණි. එහි සුවිශේෂී කරුණු කිහිපයක්ම වේ.

**(255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනත - නියමය**

(2 වන අධිකාරය වූ) අර්ථ නිරූපණ ආඥාපනතේ 18 වන වගන්තිය සමග කියවියි යුතු (255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනතේ 2 වන සහ 5 වන වගන්තිවලින්ද (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 27ඊ වගන්තියෙන්ද මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය ෆයිසර් මුස්තාෆා වන මම 2006 ජනවාරි මස 04 වන දිනැති අංක 1426/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කැස්බෑව නගර සභාවට අදාළ නියමය මෙයින් තවදුරටත් සංශෝධනය කරමි.

1. එහි (4) වන ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්,

"(4) කැස්බෑව නගර සභාව පහත දැක්වෙන i, ii සහ iii වන ඡේද ප්‍රකාර තෝරා පත් කරනු ලබන සභික සංඛ්‍යාවකින් සමන්විත විය යුතු යැයි නියම කරමි.

i. (255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය ප්‍රකාර තෝරා පත්කර ගත යුතු සභිකයින් විසි දෙනෙකුගෙන්ද,

ii. (255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනතේ 5 වන වග්නිතයේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ප්‍රකාර තෝරාගත යුතු හය දෙනෙකුගෙන් උපරිමයකින් යුතු සභික සංඛ්‍යාවකින්ද,

iii. (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 27ඊ වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාර පත් කළ යුතු කාන්තා සභිකයින් අට දෙනෙකුගෙන් ද සමන්විත විය යුතුය.''

මෙම නියමය 2017 ජුලි මස 01 වන දින සිට ක්‍රියාත්මක විය යුතුය.

**ෆයිසර් මුස්තාෆා**
**පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.**

# වර්තමාන කැස්බෑව නගර සභාව

(2018 සිට 2022)

**සභාපති** - **ලක්ෂ්මන් පෙරේරා මහතා**

**උප සභාපති** - **කරුණාපාල මුහන්දිරම් ආරච්චි මහතා**

නගර සභා මන්ත්‍රී - සුමන විවියන් රණවීර මහතා

නගර සභා මන්ත්‍රී - ධර්මදාස පණ්ඩිතරත්න මහතා

නගර සභා මන්ත්‍රී - ගර්මන් කුලසිරි වටරැක මහතා

නගර සභා මන්ත්‍රී - ලලිත් රෝහණ ලියනගේ මහතා

නගර සභා මන්ත්‍රී - කල්ප තුෂාන්ත පෙරේරා මහතා

නගර සභා මන්ත්‍රී - ඒ. එල්. ඩී. ජයවතී මහත්මිය

නගර සභා මන්ත්‍රී - ඩබ්. ඒ. ඒ. ඩී. ඩික්සන් අතුකෝරල මහතා

නගර සභා මන්ත්‍රී - කේ. මොහාන් පෙරේරා මහතා

නගර සභා මන්ත්‍රී - පී. ඩී. කමල් රංජන මහතා

නගර සභා මන්ත්‍රී - ප්‍රසාත් රාජපක්ෂ පෙරේරා මහතා

නගර සභා මන්ත්‍රී - එන්. ඩී. රංජිත් පද්මසිරි මහතා

නගර සභා මන්ත්‍රී - ඩී. ඩී. ෂර්ලි දෙයාලගේ මහතා

නගර සභා මන්ත්‍රී - එච්. ඒ. දයාංගනී මහත්මිය

නගර සභා මන්ත්‍රී - එස්. ඒ. ලලිතා පද්මසීලි මහත්මිය

නගර සභා මන්ත්‍රී - ආර්. කේ. ප්‍රේමරත්න මහතා

නගර සභා මන්ත්‍රී - ඩී. තොෂාන් ධම්මික ලොකුගේ මහතා

නගර සභා මන්ත්‍රී - එස්. ඒ. අතුල සමන් සේනානායක මහතා

නගර සභා මන්ත්‍රී - ඩී. ඩී. ඒ. ඩී. සැම්සන් මහතා

නගර සභා මන්ත්‍රී - එම්. ටෙනිල් රත්නසිරි ප්‍රනාන්දු මහතා (ප්‍රතිපක්ෂ නායක)

නගර සභා මන්ත්‍රී - කේ. ඒ. ඩී. හේමසිරි මහතා

නගර සභා මන්ත්‍රී - ඩී. එම්. ඩී. සමන් ප්‍රසන්න මහතා

නගර සභා මන්ත්‍රී - පද්මසිරි රණවකආරච්චි මහතා

නගර සභා මන්ත්‍රී - ඩබ්. ඩී. උපසේන මහතා

නගර සභා මන්ත්‍රී - පී. ඩී. පද්මිණී රාජකරුණා මහත්මිය

නගර සභා මන්ත්‍රී - ඩී. කේ. ශ්‍රියාණිලතා පෙරේරා මහතා

නගර සභා මන්ත්‍රී - කණිෂ්කා මධුරංගි ප්‍රනාන්දු මහත්මිය

නගර සභා මන්ත්‍රී - චාමර මද්දුමකළුගේ මහතා

නගර සභා මන්ත්‍රී - පී. වසන්තා මාලනී මහත්මිය

නගර සභා මන්ත්‍රී - ආර්. එම්. ජයන්ත බණ්ඩාර සෙනෙවිරත්න මහතා

නගර සභා මන්ත්‍රී - ජේ. වී. අසංක සොයිසා මහතා

නගර සභා මන්ත්‍රී - එම්. හේමාල් ධර්මප්‍රිය මහතා

නගර සභා මන්ත්‍රී - චරණ චන්ජිත කත්‍රිආරච්චි මහතා

නගර සභා මන්ත්‍රී - ඩබ්. සුජීවා නිශාන්ති චන්ද්‍රසිරි මහත්මිය

නව කොට්ඨාශ ක්‍රමය අනුව කැස්බෑව නගර සභාවට තේරී පත් වූ ඉහත සභික සංඛ්‍යාව 2018.03.09 දිනැති ගැසට් පත්‍රයේ පළ කර තිබුණේ පහත සඳහන් පරිදිය.

## තෝරා පත්කර ගත් සභිකයින්

1. ඇරැව්වල - පණ්ඩිතරත්නගේ දොන් ධර්මදාස
2. රත්මල්දෙණිය - මුහන්දිරම් ආරච්චිගේ කරුණාපාල
3. මහල්වරාව - කංකානිගේ මෝහන් පෙරේරා
4. පැලැන්වත්ත - ලලිත් රෝහණ ලියනගේ
5. බෝකුන්දර - පෝරගේ දොන් කමල් රංජන
6. මාම්පේ - දොන් සුමන විවියන් රණවීර
7. හොන්නන්තර - රාජපක්ෂ පතිරගේ ප්‍රසාත් පෙරේරා
8. මාවිත්තර - නාහල්ලගේ දොන් රංජිත් පත්මසිරි
9. විශ්වකලාව - දෙයාලගේ දොන් ෂර්ලි දෙයාලගේ
10. තුම්බෝවිල - ලියනගේ කල්ප තුෂාන්ත පෙරේරා
11. වෑවල - හෙට්ටි ආරච්චිගේ දයාංගනී
12. සුවාරපොළ - වටරැක කංකානම්ගේ දොන් ගර්මන් කුලසිරි
13. කොළමුන්න - අබේගොඩ ලියනගේ දෝන ජයවතී
14. කැස්බෑව - සින්ගන්කුට්ටි ආරච්චිගේ ලලිතා පද්මසීලි
15. හල්පිට - රණවීර කෝරළලාගේ ප්‍රේමරත්න
16. බටුවන්දර - වීරපේපෙරම අච්චි අතුකෝරළගේ දොන් ඩික්සන් අතුකෝරළ
17. බටකැත්තර - දොන් තොෂාන් ධම්මික ලොකුගේ
18. දම්පේ - සේනානායක ආරච්චිගේ අතුල සමන් සේනානායක
19. පොල්හේන - පොල්වත්තගේ ලක්ෂ්මන් පෙරේරා
20. කහපොල - දොන් දිමිංගු ආරච්චිගේ දොන් සැම්සන්

## තෝරා එවා ඇති සභිකයින්

රණවක ආච්චිගේ දොන් පද්මසිරි

දොන් මනිවෙල්ගේ දොන් සමන් ප්‍රසන්න

කරව්ගොඩ ආරච්චිගේ හේමසිරි

මංඩඩිගේ ටෙනිල් රත්නසිරි ප්‍රනාන්දු

වික්‍රමගේ දොන් උපසේන

පාදුක්කගේ දෝන පද්මිනී රාජකරුණා

දුමන් කෝරාලගේ ශ්‍රියානිලතා පෙරේරා

මංත්‍රීහේවාගේ කණිෂ්කා මධුරංගි ප්‍රනාන්දු

මද්දුම කළුගේ චාමර

පතිරණගේ වසන්තා මාලනී

ආර්. ඇම්. ජයන්ත බණ්ඩාර සෙනෙවිරත්න

ජේ. වී. අසංක සොයිසා

මුනිතන්තිරිගේ හේමාල් ධර්මප්‍රිය

චරණ වන්ජිත කත්‍රිආරච්චි

විතානගේ සුජීවා නිශාන්ති චන්ද්‍රසිරි

# කැස්බෑව නගර සභාව

2018.02.10 දින නව පළාත් පාලන
මැතිවරණය ක්‍රමය අනුව තේරී පත් වූ ධුරදාරීන්
**(ධුර කාලය ආරම්භය 2018.03.20)**




ප්‍රතිපක්ෂ නායක
එම්.ටෙනිල් රත්නසිරි ප්‍රනාන්දු මහතා
නගර සභා මන්ත්‍රී
කේ.ඒ.ඩී.හේමසිරි මහතා
නගර සභා මන්ත්‍රී
ඩී.එම්.ඩී.සමන් ප්‍රසන්න මහතා
නගර සභා මන්ත්‍රී
ආර්.ඒ.ඩී.පද්මසිරි මහතා
නගර සභා මන්ත්‍රී
ඩබ්.ඩී.උපසේන මහතා
නගර සභා මන්ත්‍රිනී
ඩී.කේ.ශ්‍රියාණිලතා පෙරේරා මහත්මිය
නගර සභා මන්ත්‍රිනී
පී.ඩී.පද්මිණි රාජකරුණා මහත්මිය
නගර සභා මන්ත්‍රිනී
එම්.කණිෂ්කා මධුරංගි ප්‍රනාන්දු මහත්මිය
නගර සභා මන්ත්‍රී
චාමර මද්දුම කළුගේ මහතා
නගර සභා මන්ත්‍රිනී
පී.වසන්තා මාලනී මහත්මිය
නගර සභා මන්ත්‍රී
ආර්.එම්.ජයන්ත බණ්ඩාර සෙනෙවිරත්න මහතා
නගර සභා මන්ත්‍රී
ජේ.වී.අසංක සොයිසා මහතා
නගර සභා මන්ත්‍රී
එම්.හේමාල් ධර්මප්‍රිය මහතා
නගර සභා මන්ත්‍රී
වරුණ චන්දිත කලිආරච්චි මහතා
නගර සභා මන්ත්‍රිනී
ඩබ්.සුජීවා ශිශාන්ති චන්ද්‍රසිරි මහත්මිය